මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் அமைச்சு
Ministry of Mahaweli Development and Environment

SRI LANKA NEXT
නීලහරිත යුගයක්



# ශ්‍රී ලංකා නෙක්ස්ට්

## නීල හරිත යුගයක් 2018

## පාරිසරික සම්මන්ත්‍රණය හා ප්‍රදර්ශනය

**19 - 20 ඔක්තෝබර් 2018**

**බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ**



ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් විසින් පැරිස් ගිවිසුම අපරානුමත කිරීමෙන් අනතුරුව 2016 සැප්තැම්බර් මස 21වන දින නිව්යෝක් නුවරදී එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනය අමතමින්

ශ්‍රී ලංකා ජනාධිපති

இலங்கை சனாதிபதி

**President of Sri Lanka**

**පණිවුඩය**

ශ්‍රී ලංකාව නීල හරිත යුගයක් කරා රැගෙන යෑමේ දැක්ම ඇතිව මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන "ශ්‍රී ලංකා නෙක්ස්ට් - නීල හරිත යුගයක්" ජාතික වැඩසටහනෙහි පාරිසරික සම්මන්ත්‍රණය හා ප්‍රදර්ශනය තෙවන වරටත් සංවිධානය කිරීමට හැකිවීම පිළිබඳ සතුටු වෙමි.

නව දැක්මක් සහිත ව දියත් වන "ශ්‍රී ලංකා නෙක්ස්ට් - නීල හරිත යුගයක් " වැඩසටහන මගින් වර්තමානයේ ජනතාව මුහුණපා ඇති ගැටලු සඳහා මෙන් ම අනාගතයේ දී මුහුණපෑමට සිදුවන අභියෝග සඳහා ද පිළිතුරු සෙවීමට අවස්ථාව උදාවී ඇත. ඒ යටතේ, දේශගුණ විපර්යාස හා ඒ මගින් ඇතිවන අහිතකර බලපෑම අවම කරගැනීම හා ඒ සඳහා අනුගත වීම, පොලිතින් හා ප්ලාස්ටික් අවභාවිතාව මගින් සිදුවන පරිසර දූෂණය වැළැක්වීම, පරිසර හිතකාමී බලශක්ති ප්‍රභව වෙත යොමුවීම, හරිත රැකියා ප්‍රවර්ධනය, හරිත නගර හා ගම්මාන පිළිබඳ සංකල්පය සමාජගත කිරීම ආදිය වෙත ප්‍රමුඛ අවධානය යොමු වී ඇත.

ජනතාවට වගකිවයුතු රජයක් ලෙස, නීල හරිත යුගයක් උදෙසා වන ගමන්මගෙහි අප වැදගත් සන්ධිස්ථාන රැසක් මේ වන විට පසු කර ඇත. දේශගුණ විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුමට පාර්ශ්ව වීම හා ඒ සඳහා වන ජාතික දායකත්වය දැක්වීමත්, නීල හරිත අය - වැයක් ප්‍රකාශයට පත් කිරීමත් ඒ අතරින් ප්‍රධාන වේ. මේ සියලු සැලසුම් සහ වැඩසටහන් දියත් වනුයේ 2030 වන විට තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ දැවැන්ත අභියෝගය හා වගකීම හා සබැඳෙමිනි.

එහි දී සමාජයේ කිසිවකු මග නොහැරීමේ සංකල්පය පදනම් කර ගනිමින් අප රට තුළ තිරසර සංවර්ධනයක් උදා කර ගැනීම සඳහා කටයුතු කිරීම අපගේ වගකීමයි. ඒ සඳහා අවශ්‍ය වන තාක්ෂණික දැනුම, කුසලතා, ප්‍රායෝගික අත්දැකීම් හා මූල්‍යමය සම්පාදනය මෙන්ම අන්තර්ජාතික හා කලාපීය සහයෝගීතාවය ද "ශ්‍රී ලංකා නෙක්ස්ට් - නීලහරිත යුගයක් 2018" වැඩසටහන මඟින් සම්පාදනය කෙරෙනු ඇත. එමගින් ශ්‍රී ලාංකීය ප්‍රජාවගේ සෞභාග්‍යමත් අනාගතය ගොඩනැගීම මගේ ඒකායන ප්‍රාර්ථනයයි.

"ශ්‍රී ලංකා නෙක්ස්ට් - නීල හරිත යුගයක් 2018" වැඩසටහන ඉතාමත් ඵලදායි හා අරුත්බර වැඩසටහනක් වේවා යි ප්‍රාර්ථනා කරමි.

**මෛත්‍රීපාල සිරිසේන**

**2018 ඔක්තෝබර් මස 15 වන දින**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு**

**Democratic Socialist Republic of Sri Lanka**

## මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමන්ගේ පණිවිඩය



ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්* 2018 වැඩසටහන වෙනුවෙන් පණිවිඩයක් නිකුත් කිරීමට අවස්ථාව ලැබීම මම භාග්‍යයක් සේ සලකමි.

මෙවර 2018 වසරේ ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්* වැඩසටහන පවත්වන්නේ ඉතා උචිත පසුබිමක සිටය. එනම්, අප නීල හරිත අය-වැයක් යටතේ රට ආර්ථික වර්ධනයක් කරා යොමු කරමින් ඇත. එයට අමතරව පැරිස් ගිවිසුමේ පාර්ශව රටක් වශයෙන් ඒ සඳහාවන ජාතික දායකත්වය අප අන්තර්ජාතිකව දක්වා ඇත. එසේම, මොරගහකන්ද, කළු ගඟ, උමා ඔය වැනි දැවැන්ත වාරි කර්මාන්ත රටට උරුම කර ඇත. එවන් තත්ත්වයක් සිට අනාගත මිහිතලයේ සුරක්ෂාව සඳහා සමාජයේ සෑම ස්ථරයකම ධාරිතාවය වර්ධනය කල යුතුව ඇත. ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්* 2018 වැඩසටහන මෙම අවශ්‍යතාවය සපුරාලයි. එසේම ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්* 2018 වැඩසටහන මගින් රාජ්‍ය හා පෞද්ගලික අංශය ශක්තිමත් කරමින් සියලු දෙනා ඇතුලත්වූ සංකල්පය සහිතව තිරසාර සංවර්ධන සඳහා මග විවර කරනු ලබයි.

"පුනරුදය" පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන මගින් වර්තමානයේ අප හමුවේ ඇති පාරිසරික ගැටළු රැසක් හඳුනාගෙන ඇත. අවිධිමත් කසළ අපහරණය ඇතුළු පරිසර දූෂණය, වන සම්පත ප්‍රමානාත්මකව හා ගුණාත්මකව පිරිහීම, භූමි හායනය මෙන්ම පරිසර සංරක්ෂණය පිලිබඳ ජන විඥානය, අවධානය හා උද්යෝගය අඩුවීම ආදිය මෙලෙස හඳුනාගත් ප්‍රධාන පාරිසරික ගැටළු කීපයකි. ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්* 2018 වැඩසටහන මගින් මෙම ගැටළු ආමන්ත්‍රණය කිරීමට වේදිකාවක් සලසන අතර, එය ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමක් ද වේ.

මෙම තත්ත්වය මත, ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්* වැඩසටහන සුවිශේෂීය හා කැපීපෙනෙන වැඩසටහනක් ලෙස හඳුන්වනු කැමැත්තෙමි. එමගින් නවතම දැනුම හා විකල්ප විසඳුම් එළිදක්වමින් පරිසරය හා සම්බන්ධව පුළුල් ජනතා කතිකාවතක් ඇතිකරනු ලබයි. මෙවර ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්* වැඩසටහන තුළ පාසැල් සිසුන්, සාමාන්‍ය ජනතාව, නව නිර්මාණකරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, පර්යේෂකයන්, රාජ්‍ය නොවන සංවිධාන ඇතුළුව පුළුල් පරාසයක සහභාගීත්වයක් සහිත කතිකාවකට අවස්ථාව සලසා ඇති බව මම සතුටින් ප්‍රකාශ කරමි.

මෙම අවස්ථාව උපරිමව ප්‍රයෝජනයට ගෙන නීල හරිත ශ්‍රී ලංකාවක් බිහිකිරීමට ඔබගේ දායකත්වය ලබාදීමට මෙය අවස්ථාවක් කරගන්නා ලෙස ඉල්ලමින් ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්* 2018 වැඩසටහන අති සාර්ථක වැඩසටහනක් වේවායි පතමි.

**අජිත් මාන්නප්පෙරුම පා.ම.**
**නියෝජ්‍ය අමාත්‍ය**
**මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**

## මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමන්ගේ පණිවිඩය



ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්* වැඩසටහන සඳහා පණිවිඩයක් එක්කිරීමට ලැබීම මම භාගයක් සේ සලකමි.

වර්තමානයේ විවිධ පාරිසරික ගැටළු රැසක් අප හමුවේ උද්ගතව ඇති අතර එම ගැටළු සඳහා පිලියම් යෙදිය යුතුව ඇත. දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම් ඒ අතරින් එක් ප්‍රමුඛ ගැටළුවක් බවට පත්ව ඇති අතර එය ලොව පුරාම පාහේ පොදුවේ දැකිය හැක. මෙම තත්ත්වය විවිධාකාර සමාජ, ආර්ථික මෙන්ම දේශපාලනික ගැටළු රැසක් නිර්මාණය කිරීමට ද පසුබිම සලසනු ලබයි. එබැවින් මෙම දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම් සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම අප සතු වගකීමකි.

මෙම තත්ත්වය යටතේ සැලකීමේදී, එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ (UNFCCC) 21 වැනි පාර්ශව කරුවන්ගේ සම්මේලනයේදී (COP21) ලෝක ප්‍රජාව මගින් සම්මත කරන ලද "පැරිස් ගිවිසුම" දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම්වලට එරෙහිව කටයුතු කිරීම සඳහා කදිම මෙවලමක් වේ. පැරිස් ගිවිසුමේ පාර්ශව රටක් ලෙස අප දැනටමත් ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්වය (NDCs) අන්තර්ජාතික ප්‍රජාවට දක්වා ඇත.

වර්තමානයේ ලෝකය තිරසාර සංවර්ධනය කරා පියමනිමින් ඇත. මෙම ගමන සාර්ථක කරගැනීමට නම් අප සතුව පවතින සීමිත සම්පත් භාවිතය සඳහා නිර්මාණශීලී උපාය මාර්ග, ක්‍රමවේද සහ ප්‍රවේශයන් අවශ්‍ය වේ. එසෙම අප තරුණ පරපුර නිර්මාණශීලී දේශගුණික සුහුරු ඇරඹුමක් සඳහා නායකත්වය දැරීමට මෙහෙයවිය යුතුව ඇත.

ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්* වැඩසටහන ඉහත අවශ්‍යතාවයන් සපුරාගැනීම සඳහා ඉඩ ප්‍රස්ථාව උදාකරනු ලබයි. එසේම ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්* වැඩසටහන මගින් නීල හරිත ආර්ථිකයක් කරා අප යන ගමන වේගවත් කිරීමට අවස්ථාව සලසන බව ද පවසනු කැමැත්තෙමි. මෙහිදී, අපගේ අභිප්‍රාය වන්නේ නීල හරිත යුගයක් කරා සමාජය මෙහෙයවීම මගින් ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්* වැඩසටහනේ අපේක්ෂිත අරමුණ ඉටුකරගැනීමට අපගේ සම්පූර්ණ සහාය ලබාදීමයි.

ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්* 2018 වැඩසටහන මගින් සමාජයේ සෑම ස්ථරයක්ම අතරම කතිකාවතක් ඇති කිරීමට කාර්යක්ෂම වේදිකාවක් නිර්මාණය කරන අතර ඒ තුළින් නීල හරිත ආර්ථිකයක් කරා යොමුවීමට අවස්ථාව සැලසෙනු ඇත.

ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්* වැඩසටහන අති සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමි.

**වීරකුමාර දිසානායක පා.ම.**
**මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍ය**

## මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමන්ගේ පණිවිඩය



ගුණාත්මයෙන් ඉහල යහපත් පරිසරයක් පැවතීම සමස්ත ජීවයේම පැවැත්ම උදෙසා අතිශය වැදගත් සාධකයකි. පරිසර විෂය භාර අමාත්‍යාංශය ලෙස සුවදායි, ප්‍රසන්න පරිසරයක් පවත්වාගැනීම තුළින් ජනතාවගේ යහපැවැත්ම හා සමාජ ආර්ථික වර්ධනය තහවුරු කිරීමේ භාරදූර වගකීම අප වෙත පැවරී ඇත. මේ හා සම්බන්ධව අප විසින් ස්වභාවික සම්පත් තිරසාර භාවිතය තහවුරු වන පරිදි ව්‍යාපෘති, වැඩසටහන් හා ක්‍රියාකාරකම් රැසක් ක්‍රියාත්මක කරමින් ඇත.

මෙම අමාත්‍යාංශය මගින් වර්තමානයේ අප රටේ ප්‍රජාව මුහුණදී ඇති ප්‍රධාන පරිසර ගැටළු සඳහා විසඳුම් ලබාදීමට උපාය මාර්ගික ප්‍රවේශයන් රැසක් දියත් කර ඇත. ඒ අනුව, පරිසර දූෂණ පාලනය හා සම්බන්ධ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීම, වන සංරක්ෂණය, පරිසර පද්ධති හා ජෛව විවිධත්ව සංරක්ෂණය, භූමි සම්පත තිරසාර භාවිතය, ජලාශ සහ ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය, පරිසරය පිළිබඳ දැනුවත් කිරීම් අධ්‍යාපනය හා පුහුණු, හරිත මුලාරම්භක හඳුන්වාදීම, අඩු කාබන් සංවර්ධන ක්‍රමවේද හඳුන්වාදීම මෙන්ම ආයතනික ධාරිතාවන් වර්ධනයද ඒ අතර වේ.

එයට අමතරව පරිසර විෂය භාර අමාත්‍යාංශය වශයෙන් අප විසින් අන්තර්ජාතික ගිවිසුම්, සම්මුති, සන්ධාන හා එකඟතා ක්‍රියාත්මක කිරීමට දායකත්වය සපයයි. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය පරිසරය හා සම්බන්ධ අන්තර්ජාතික සම්මුති හා සන්ධාන රැසක ජාතික කේන්ද්‍රීය ස්ථානය ලෙස සුවිශේෂිය කාර්යභාරයක් ඉටුකරනු ලබයි. එමගින් අන්තර්ජාතික වශයෙන් වැදගත් දායකත්වයන් රැසක් ලොවට ජනිත කිරීමට ද හැකියාව ලැබී ඇත.

පැරිස් ගිවිසුම ක්‍රියාත්මක කිරීමේදීත්, තිරසාර සංවර්ධනය පිළිබඳ 2030 න්‍යාය පත්‍රය හා එක්සත් ජාතීන්ගේ බැඳීම් ක්‍රියාත්මක කිරීමේදීත් මෙම අමාත්‍යාංශය සුවිශේෂිය දායකත්වයන් පෙන්නුම්කර ඇත.

ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්* වැඩසටහන මෙම දායකත්වයන් ප්‍රදර්ශනය කිරීම සඳහා වේදිකාවක් නිර්මාණය කරන අතර හරිත නිපැයුම්කරුවන්ට හා දැනුම දරන්නන්ට තම අත්දැකීම් හා අදහස් හුවමාරු කරගැනීමට අවස්ථාව සලසනු ලබයි.

වර්තමානයේ අප "විෂන් 2025" වැඩසටහන ක්‍රියාත්මක කිරීම, තිරසාර සංවර්ධන ඉලක්ක නීල හරිත ආර්ථිකයට හඳුන්වාදීම, පරිසර ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම වැනි කාර්යන්හි නිරතව ඇත. මෙම තත්ත්වය මත ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්* වැඩසටහන රජය, සිවිල් සමාජය, පෞද්ගලික අංශය, අධ්‍යාපනඥයින්, මාධ්‍යකරුවන් මෙන්ම විශේෂඥයින් සඳහා අනාගත ශ්‍රී ලංකාවේ නීල හරිත ආර්ථික සංවර්ධනයක් උදෙසා කටයුතු කිරීමට වේදිකාවක් නිර්මාණය කරනු ලබයි.

ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්* 2018 වැඩසටහන සාර්ථක වේවායි ප්‍රර්ථනා කරමි.

**අනුර දිසානායක**
**ලේකම්**
**මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**

## පූර්විකාව

සොබාදහම මිහිමත මිනිස් ජීවය පවත්වා ගැනීම සඳහා මහඟු කර්තව්‍යක් ඉටු කරයි. එහෙත්, මිනිසුන් එම සහ-සම්බන්ධතාවය නොසලකා හරිමින් කටයුතු කිරීම මානව පැවැත්ම මෙන්ම අනෙකුත් පරිසර පද්ධතීන්වල පැවැත්මද අභියෝගයට ලක් කරයි. අප අද වර්තමානයේ හොඳින්ම අත්දකින දේශගුණික විපර්යාස සහ දිනෙන් දින ඉහළ යන ආපදා දර්ශකයන් හමුවේ වුවද මානවයා, සොබාදහම හා ආර්ථික වර්ධනය අතර සමතුලිතය ආරක්ෂා කිරීමට යුහුසුළු වන බවක් නොපෙනේ. ශ්‍රී ලාංකිකයන් වන අප, අපගේ ශිෂ්ටාචාරය තුළ අවුරුදු දහස් ගණනක් තිස්සේ මිහිමව හා සහජීවනයෙන් ජීවත් වූ ප්‍රෞඪ ජාතියකි. කෙසේ වෙතත්, මෑත අතීතයේ දී අප අනුගමනය කරන්නට යෙදුනු සංවර්ධන ක්‍රියාකාරකම් හේතුවෙන් අපි ද පාරිසරික තිරසාරභාවයෙන් ඔබ්බට ගමන් කරමින් සිටින්නෙමු.

අද මානව ශිෂ්ඨාචාරය මුහුණ දෙන ප්‍රධානතම අභියෝගයක් වන්නේ, වායුගෝලයට හරිතාගාර වායු විමෝචනය නිසා ඇතිවන දේශගුණික විපර්යාසයන් වල අහිතකර ප්‍රතිඵලයන් වේ. සංවර්ධනය වෙමින් පවතින දූපත් රාජ්‍යයක් වන ශ්‍රී ලංකාව දේශගුණික විපර්යාසයන්ගේ අහිතකර බලපෑම්වලට ලක්වීමේ ඉහළ අවදානමක් ඇති රටකි. ලෝක ජනගහනය සීග්‍රයෙන් වැඩිවෙමින් පවතින අතර එය 2050 වන විට තවත් බිලියන 2 කින් වැඩි වනු ඇති බවට ගණන් බලා ඇත. ඉන් ගම්‍ය වනුයේ ඉදිරි දශක කිහිපය තුළ මානව ක්‍රියාකාරකම් සහ හරිතාගාර වායු විමෝචන ප්‍රමාණය වැඩිවීමේ ඉහළ සම්භාවිතාවයක් පවතින බවයි. ගෝලීය උෂ්ණත්වය වැඩිවීම සෙල්සියස් අංශක දෙකකින් ඉහල යාම වළකාලීම සඳහා මානව ප්‍රජාව විසින් ඉක්මන් ක්‍රියාමාර්ග නොගතහොත්, එහි අහිතකර ප්‍රතිවිපාක ආපසු හැරවිය නොහැකි වනු ඇත.

2016 ජනවාරි මාසයේ දී ඇරඹුණු ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්* වැඩසටහන මඟින් ශ්‍රී ලංකාව, දේශගුණ විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුම සහ තිරසාර සංවර්ධන ඉලක්ක අනුව යමින් දේශගුණික අනුහුරු ක්‍රමෝපායන් සහ අඩු කාබන් විමෝචන සංවර්ධන ක්‍රියාවලීන් වෙත යොමු වීම සඳහා වූ සිය කැපවීම ප්‍රදර්ශනය කර ඇත. ශ්‍රී ලංකා නෙක්ස්ට් නීල හරිත යුගයක් සමුළුව හා ප්‍රදර්ශනය, 2018 ඔක්තෝම්බර් මස 19 හා 20 දින වලදී බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී තෙවන වරටත් පැවැත්වීමට ලැබීම ජාතියක් ලෙස අප ලද ජයග්‍රහණයකි. ශ්‍රී ලාංකීය ජනතාවට නීල හරිත ආර්ථික සංකල්ප සහ තිරසාර සංවර්ධන සංකල්ප පිළිබඳ දැනුම ලබාදී පරිසර තිරසරභාවය සමගින්ම ආර්ථික සංවර්ධනය ළඟා කරගනු වස් ඔවුන්ගේ ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීම මෙම වැඩසටහන තුළින් අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්* 2018 වැඩසටහන රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය, සිවිල් සමාජ, විශ්වවිද්‍යාල සහ විවිධ ක්ෂේත්‍රවල විශේෂඥයින්, පෞද්ගලික, රාජ්‍ය නොවන සහ ප්‍රජා මූලික සංවිධානවල සාමූහික උත්සාහයේ ප්‍රතිඵලයකි. මෙම අවස්ථාව සාර්ථකව සංවිධානය කර ගැනීම සඳහා සහයෝගය ලබා දුන් සියලු පාර්ශවකරුවන්ට අපගේ කෘතඥතාවය මෙයින් පිරිනැමෙන අතරම ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්* 2018 වැඩසටහන සඳහා ඔබගේ සහභාගීත්වය ගෞරව පූර්වකව අගය කොට සලකන්නෙමු.

**ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්* ලේකම් කාර්යාලය 2018**

**සභාපති:**

රියර් අද්මිරාල් රෝහණ පෙරේරා, සභාපති, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

**සමායෝජක:**

ආචාර්ය සුනිමල් ජයතුංග, දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය,
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය


## බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව (BMICH)



බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව (BMICH) ශ්‍රී ලංකාවේ කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටි සම්මේලන මධ්‍යස්ථානයක් වේ. 1956 - 1959 දක්වා ශ්‍රී ලංකාවේ හිටපු අග්‍රාමාත්‍ය සොලමන් රිජ්වේ ඩයස් බණ්ඩාරනායක මහතා සිහිවීම පිණිස 1973 වර්ෂයේ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව ආරම්භ කරන ලදී.

එය දකුණු ආසියාවේ හොඳම සම්මන්ත්‍රණ මධ්‍යස්ථානය වන අතර ආසියාවේ සම්මන්ත්‍රණ මධ්‍යස්ථාන අතර ප්‍රධාන තැනක් ගනී. එය උපරිම වෘත්තීය පහසුකම් වලින් සමන්විත අතර මනරම් වූ ස්වභාවික වටපිටාවකින් යුක්තය. 1998 වර්ෂයේ දී සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ප්‍රදර්ශණ මධ්‍යස්ථානයද මෙයට එක්විය. බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය ශ්‍රී ලංකාවේ ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වන එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම (BNMF) මගින් පාලනය වේ.

# බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ බිම් සැලසුම



## ඉලක්කය: නීල හරිත ආර්ථික මූලාරම්භය (Initiative) මගින් ශ්‍රී ලංකාව තුළ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම

| ප්‍රධාන අරමුණු : | |
|---|---|
| | දේශගුණ විපර්යාස මගින් ඇතිවන ගැටළු වලට මුහුණ දීමට දේශීය, කලපීය සහ ගෝලීය වශයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග/ උත්සාහයන් පිළිබඳ යාවත්කාලීන දැනුම රැස්කර ගැනීම සහ ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියට/ න්‍යාය පත්‍රයට ඉවහල්කර ගැනීම/ යොදා ගැනීම සඳහා එම දැනුම බෙදා හැරීම |
| | ප්‍රධාන වශයෙන් දායක වන පාර්ශව (key stakeholders) සහ සාමාන්‍ය ජන සමාජය තුල පරිසරය සහ නීල හරිත ආර්ථිකය පිළිබඳ අවබෝධය ඇතිකිරීම තුලින් ඔවුන්ගේ ක්‍රියාකාරී දායකත්වය ශ්‍රී ලංකාවේ ආර්ථික සහ පාරිසරික තිරසාරත්වය ළගාකර ගැනීම සඳහා ලබා ගැනීම |
| | පරිසර සංරක්ෂණය සහ පාරිසරික නවෝත්පාදන සඳහා මූලික වී, ආරම්භයේ සිට කැපවී කටයුතු කරන පුද්ගලයින් විසින් තිරසාර සංවර්ධනය ළගාකර ගැනීමට ලබාදුන් ක්‍රියාකාරී දායකත්වය ඇගයීමට ලක් කිරීම මගින් ඔවුන් ධෛර්යමත් කිරීම සහ අගය කිරීම |
| | ජාල ගතවීම/ ජාලකරණය (Networking), සම්බන්ධීකරණය, සංහතිය සහ සමමුහුර්තතා (Coherence and Synergies) බලගැන්වීම මගින් ශ්‍රී ලංකාව තුල ඔරොත්තුදීමට අවශ්‍ය හැකියාව, ධාරිතාවය වැඩිදියුණු කිරීම සහ එමගින් දැනුම, උසස් ක්‍රියාවිධි (Best practices) සහ අත්දැකීම් දායකවන පාර්ශව (stakeholders) අතර හුවමාරු කරගැනීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම |
| | ජාතික වශයෙන් යෝග්‍ය හරිතාගාර වායු අවමකිරීමේ ක්‍රියාකාරකම් (NAMAs) මගින් හරිතාගාර වායු විමෝචනය අවම කිරීමට (GHG Mitigation) ධෛර්යමත් කිරීම සහ දේශගුණික විපර්යාස සඳහා අනුගතවීමේ/ අනුහුරුවීමේ (Adaptation) ක්‍රියාමාර්ග මගින් ශ්‍රී ලංකාවේ ගොදුරු විය හැකි (Vulnerable) අංශ, කලාප, සහ ජන කොට්ඨාශ තුල ඔරොත්තුදීමේ (Resilience) හැකියාව වැඩිදියුණු කිරීම |
| | පැරිස් සම්මුතිය ඇතුළු අනෙකුත් බහු පාර්ශවීය පාරිසරික ගිවිසුම් සඳහා වූ ජාතික කැපවීම ඉටුකිරීම |

**ප්‍රධාන අවස්ථා:**

- ජනාධිපති පරිසර සම්මාන උළෙල 2018
- පාරිසරික ප්‍රදර්ශනය
- දේශගුණික විපර්යාස පිළිබඳ මාධ්‍ය සංසදය
- පාසල් දැනුවත් කිරීමේ වැඩසටහන
- දෙවන අන්තර්ජාතික බනිජ සම්මන්ත්‍රණය
- "සොබා වලන සිතුවම්" කෙටි චිත්‍රපට උළෙල ත්‍යාග ප්‍රදානෝත්සවය
- සමුද්‍ර පරිසරය පිළිබඳ සිව්වන ජාතික විද්වත් සමුළුව
- තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය පිලිබඳ ජාතික කතිකාවත
- දේශගුණික විපර්යාස පිළිබඳ ගෝලීය තරුණ සංසදය
- නීල හරිත ගම්මාන කතිකාව
- වන පර්යේෂණ සම්මන්ත්‍රණය
- දේශගුණික විපර්යාස පිළිබඳ ව්‍යාපාරික සමුළුව
- දේශගුණ විපර්යාස පර්යේෂණ සමුළුව
- කඩොලාන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව
- සමුද්‍ර පරිසරය පිළිබඳ සිව්වන ජාතික විද්වත් සමුළුව
- රාජ්‍ය-පුද්ගලික-ප්‍රජා සහයෝගීතාවයෙන් ජාතික රුක් රෝපණ වැඩසටහන ප්‍රවර්ධනය කිරීම

## පටුන


01
- අතිගරු ජනාධිපතිතුමන්ගේ පණිවිඩය.......................................................................1

02
- මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමන්ගේ පණිවිඩය......................2

03
- මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමන්ගේ පණිවිඩය...........................................3

04
- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමන්ගේ පණිවිඩය..............4

05
- පූර්විකාව.....................................................................................................5

06
- හැඳින්වීම - බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව.............6

07
- බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ බිම් සැලසුම.............................................7

08
- ජනාධිපති පරිසර සම්මාන උළෙල 2018........................................................10

09
- පාරිසරික ප්‍රදර්ශනය.......................................................................................11

10
- දේශගුණික විපර්යාස පිළිබඳ මාධ්‍ය සංසදය..............................................12-13

11
- පාසල් දැනුවත් කිරීමේ වැඩසටහන..............................................................14

12..
- දෙවන අන්තර්ජාතික ඛනිජ සම්මන්ත්‍රණය ................................................ 15-16

13
- "සොබා වලන සිතුවම්" කෙටි චිත්‍රපට උළෙල ත්‍යාග ප්‍රදානෝත්සවය..................17

14
- සමුද්‍ර පරිසරය පිළිබඳ සිව්වන ජාතික විද්වත් සමුළුව....................................18-19

15
- තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය පිළිබඳ ජාතික කතිකාවත............20-21-22-23

16
- දේශගුණික විපර්යාස පිළිබඳ ගෝලීය තරුණ සංසදය.............................24-25-26

17
- නීල හරිත ගම්මාන කතිකාව.........................................................27-28-29

18
- වන පර්යේෂණ සම්මන්ත්‍රණය......................................................30-31-32-33

19
- දේශගුණික විපර්යාස පිළිබඳ ව්‍යාපාරික සමුළුව...............................................34

20
- දේශගුණ විපර්යාස පර්යේෂණ සමුළුව......................................................35-36

21
- කඩොලාන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව.......................................37-38-39

22
- සමුද්‍ර පරිසරය පිළිබඳ සිව්වන ජාතික විද්වත් සමුළුව....................................40-41

23
- රාජ්‍ය - පුද්ගලික - ප්‍රජා සහයෝගීතාවයෙන් ජාතික රුක් රෝපණ වැඩසටහන ප්‍රවර්ධනය කිරීම..........................................................................................42

# ජනාධිපති පරිසර සම්මාන උළෙල 2018

| | |
|---|---|
| **Venue:** | ප්‍රධාන ශාලාව |
| **Date:** | 2018 ඔක්තෝබර් 19 |
| **Time:** | පෙ.ව 11.50 - ප.ව 3.45 |

අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ, තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටු කර ගනිමින් ශ්‍රී ලංකාවේ "නීල හරිත යුගයක්" උදා කිරිම රජයේ ප්‍රතිපත්තිය වේ. මෙහිදී සමාජ ව්‍යුහය හා ආයතනික ව්‍යුහයන් සංවිධානය විය යුතු අතර, පරිසර සංරක්ෂණය උදෙසා මහජන සහභාගීත්වය ගොඩනැගිම වෙසෙසින්ම අත්‍යවශ්‍ය සාධකයක් වේ. එය සමාජය සංවිධානයේ පදනම ද වේ. මෙහිදී පොදු මහජනතාව, ආයතන, කර්මාන්ත, ව්‍යාපාර හා සේවා, සිවිල් සංවිධාන, ජනමාධ්‍ය ආදී සෑම පාර්ශ්වයක්ම ඒකාග්‍රකර ගැනීම අපගේ පොදු අරමුණ ජයග්‍රහනයට ඉතා වැදගත් වේ.

මෙම කාර්ය සාර්ථක කරගැනීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් (ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්*) ක්‍රියාන්විතය ඔස්සේ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක තලයට පමුණුවා ඇත. ඒ යටතේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් මෙම ජනාධිපති පරිසර සම්මාන උළෙල සංවිධානය කරනු ලබයි. පරිසර විෂය ක්ෂේත්‍රයට විශිෂ්ට මෙහෙවරක් සිදුකළ ආයතන, කර්මාන්ත හා සේවා, පාසල්, පුද්ගලයන්, සිවිල් සංවිධාන, මාධ්‍යවේදින් මෙම වැඩසටහන ඔස්සේ, ඇගයීමට ලක්කර සමාජ වටිනාකමක් ලබාදෙමින් පරිසර සංරක්ෂණ ක්‍රියාදාමය සඳහා පොදු ජන සහභාගීත්වය හා උද්‍යෝගය ඇති කරනු ලැබේ.

තිරසර යුගයක අපේක්ෂා සාධනය සඳහා, පරිසර හිතකාමී කර්මාන්ත හා සේවා සංස්කෘතියක් ඇති කිරීමත්, ඒ සඳහා පොදු ජන සහභාගීත්වය ගොඩ නැංවීමත්, හරිත ආර්ථික දහමක් ඔස්සේ ආර්ථික අභිවෘද්ධිය ඇති කිරීමට අවශ්‍ය සමාජ පසුබිම නිර්මාණය කිරීමත්, මෙම වැඩසටහනේ පරමාර්ථය වේ.

ඇගයීම් ක්‍රියාදාමය ඔස්සේ, සමාජ සංස්කෘතික හා ආයතන අංශය යටතේ, ක්ෂේත්‍ර 06 ද, කර්මාන්ත හා සේවා අංශය යටතේ ක්ෂේත්‍ර 13 ක් ද ජනාධිපති පරිසර සම්මානලාභීන් විෂය ප්‍රවීන විද්වත් විනිශ්චය මණ්ඩලයක් මඟින් තෝරා ලනු ලබන අතර ජනාධිපති පරිසර සම්මාන ප්‍රදානය 2018 ඔක්තෝබර් මස 19 වන දින පෙ.ව 10.00 ට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වේ.

**භාෂා මාධ්‍ය:** සිංහල/ ඉංග්‍රීසි

**සහභාගීත්වය:** රාජ්‍ය, කර්මාන්ත හා ව්‍යාපාර අංශයේ සම්මානලාභීන්, සිවිල් සංවිධාන, ජනමාධ්‍ය හා පාසල් යන අංශවල සම්මානලාභීන්, විද්වතුන්, පරිසර නියමු සිසු දරුවන්

**සංවිධානය හා සම්බන්ධීකරණය:**

- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය, මධ්‍යම පරිසර අධිකාරිය
- අධ්‍යක්ෂ, පරිසර දූෂණ පාලන අංශය, මධ්‍යම පරිසර අධිකාරිය

# පාරිසරික ප්‍රදර්ශනය

| | |
|---|---|
| **Venue:** | ඩෙලිගේට්ස් ශාලාව |
| **Date:** | 2018 ඔක්තෝබර් 19 |
| **Time:** | පෙ.ව 9.00 - ප.ව 5.30 |

අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ, ශ්‍රී ලංකාවේ පරිසර හා මහජන සුරක්ෂිතතාව පිණිස ඉදිරිගාමී පියවරක් තබමින් 2017 සැප්තැම්බර් මස 01 දින සිට ප්ලාස්ටික්/ පොලිතීන් නිෂ්පාදන කිහිපයක තහනමක් ක්‍රියාත්මක කරන ලද අතර, එය 2018 ජනවාරි මස 01 දින සිට සක්‍රීය ලෙස බලාත්මක කිරීමෙන් එම නිෂ්පාදන වල පාලනයක් මෙන්ම ඒවා අවිධිමත් භාවිතයෙන් ඇතිව තිබූ පාරිසරික හා සෞඛ්‍ය ගැටළු අවම කරගැනීම සඳහා ආරම්භයක් ලබාගත හැකිවිය. පොදු ජන සුබසෙත පිණිස ගනු ලැබූ මෙම තහනම ඵලදායි ලෙස ඉදිරියට ගෙන යාම සඳහා පොදු ජනතාවගේ ක්‍රියාකාරී සහය අත්‍යවශ්‍ය වේ. එබැවින් ප්ලාස්ටික්/ පොලිතීන් ඉල්ලුම අවම කරමින් පිවිතුරු සමාජ පරිසරයක් ගොඩනගා ගැනීමේ අපේක්ෂාව සාක්ෂාත් කරගැනීම උදෙසා අප සමාජයක් ලෙස කැපවී කටයුතු කළ යුතු වේ. වෙළඳපොළ ක්‍රමය තුළ පොලිතීන් නිෂ්පාදන අවම කිරීම සඳහා වූ ප්‍රධානතම වැදගත් සාධකයක් වන්නේ, ප්ලාස්ටික්/ පොලිතීන් සඳහා වන ඉල්ලුම අඩු කර ගැනීමයි. ඒවා භාවිතයෙන් ඉවත් විමෙන් හෝ පොලිතීන් වෙනුවට පරිසර හිතකාමී විකල්ප නිෂ්පාදනවලට යොමු වීමෙන් ප්ලාස්ටික්/ පොලිතීන් නිෂ්පාදන සඳහා වන ඉල්ලුම අවම කර ගැනිමට අප කටයුතු කළ යුතුව ඇත.

ශ්‍රී ලංකා නෙක්ස්ට් - පරිසර සංරක්ෂණ ක්‍රියාන්විතය ඔස්සේ ප්ලාස්ටික්/ පොලිතීන් ඉල්ලුම අවම කරගනිමින්, පරිසර හිතකාමී නිෂ්පාදන වලට යොමු වෙමින්, තිරසර සංවර්ධන අපේක්ෂා ඉටුකරගැනිම පිණිස ක්‍රියාකාරීව ජනතා සහභාගීත්වය ගොඩනැංවීමේ එක් ප්‍රවේශයක් ලෙස මෙම පාරිසරික ප්‍රදර්ශනය සංවිධානය කරන ලදී. පොලිතීන් වෙනුට පරිසර හිතකාමී විකල්ප නිෂ්පාදන වලට පොදු ජනතාව යොමු කිරිම සඳහා ඔවුන් දැනුවත් කිරීමත්, පරිසර හිතකාමී නිෂ්පාදන සිදුකරන මධ්‍ය හා කුඩා පරිමාණ දේශීය නිෂ්පාදකයන්ට තම නිෂ්පාදන ප්‍රවර්ධනයට අවස්ථාවක් සලසා දීමත්, මෙම ප්‍රදර්ශනය සංවිධානයෙන් අරමුණු කෙරෙන අතර, අපගේ පරමාර්ථය වන්නේ, පොලිතීන් භාවිතයෙන් ඉවත්විමෙන් හෝ භාවිතය අවම කිරීමෙන් පොලිතීන් නිෂ්පාදන අවිධිමත් භාවිතයෙන් වන පාරිසරික හා සෞඛ්‍ය හානි වලක්වා ගනිමින් සුරක්ෂිත පරිසරයක් තුළ තිරසර අනාගතයක් උදාකර ගැනීමයි.

**පාරිසරික ප්‍රදර්ශනය:** "ප්ලාස්ටික් පොලිතීන් ඉල්ලුම අවම කර, සුපසන් ලොවක් තනමු."

**සංවිධානය හා සම්බන්ධීකරණය:** මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය

## දේශගුණික විපර්යාස පිළිබඳ මාධ්‍ය සංසදය

| | |
|---|---|
| **Venue:** | ජෙස්මින් ශාලාව |
| **Date:** | 2018 ඔක්තෝබර් 19 |
| **Time:** | පෙ.ව 9.00 - ප.ව 5.00 |

දේශගුණික විපර්යාස පිළිබඳ මාධ්‍ය සංසදය, මාධ්‍යවේදීන් හවුල් කරගැනීම සඳහාත්, ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස පිළිබඳ සන්නිවේදන උපායමාර්ගය සඳහා යෙදවුම් ලබා ගැනීමටත්, සන්නිවේදකයන් විසින් දේශගුණික ක්‍රියාකාරකම් බලගැන්වීම සඳහාත් සහ දේශගුණික විපර්යාසවල බලපෑම පිළිබඳව දැනුවත් කිරීම සඳහාත් සංවිධානය කරනු ලබයි.

මෙම සංසදය පහත සඳහන් කරුණු වෙත අවධානය යොමු කරනු ඇත;

- ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස පිළිබඳව මාධ්‍යවේදීන් සහ සන්නිවේදකයන් අතර දැනුවත්භාවය වර්ධනය කිරීම
- ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස පිළිබඳ සන්නිවේදන උපායමාර්ග සැකසීම සඳහා යෙදවුම් ලබා ගැනීම
- දේශගුණික ක්‍රියාමාර්ග සඳහා මාධ්‍යයන් සම්බන්ධ කිරීම, දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම් පිළිබඳව අවබෝධයන් ලබාගැනීම සඳහා විද්වතුන් සහ වෘත්තිකයින් ජාලගත කිරීම සහ ශ්‍රී ලංකාවේ ඒවාට ගනු ලබන ක්‍රියාමාර්ග ජාලගත කිරීම

**සංවිධානය:** මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය, SLYCAN Trust, Janathakshan, IDEA යන ආයතන එක්ව මෙය සංවිධානය කරනු ලැබේ.

**වැඩිදුර තොරතුරු සඳහා:**

- වොසිතා විජේනායක මහත්මිය, විධායක අධ්‍යක්ෂිකා, SLYCAN Trust ආයතනය (vositha@slycantrust.org/ info@slycantrust.org)

| වේලාව | වැඩසටහන් විස්තරය |
|---|---|
| **පෙ.ව. 09.00 - ප.ව. 12.30** | ශ්‍රී ලංකා නෙක්ස්ට් නීල හරිත යුගයක් වැඩසටහන |
| **ප.ව. 12.30 - 13.30** | දිවා ආහාරය |
| **ප.ව. 13.30 - 13.45** | විශේෂිත ආරාධනය - ආචාර්ය සුනිමල් ජයතුංග, අධ්‍යක්ෂ, දේශගුණික විපර්යාස ලේකම් කාර්යාලය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය |
| **ප.ව. 13.45 – 14.00** | සංවේදී පරිසර පද්ධති කළමනාකරණය සඳහා වූ සන්නිවේදන ක්‍රමවේදය: උගත් පාඩම් - සංවේදී පරිසර පද්ධති කළමනාකරණ ව්‍යාපෘතිය |
| **ප.ව. 14.00 - 14.45** | දේශගුණික විපර්යාස සන්නිවේදනය, එහි වැදගත්කම හා දැනුවත්භාවය |
| **ප.ව. 14.15 - 14.30** | සාකච්ඡා, ප්‍රශ්න, හා පිළිතුරු සැසිය |
| **ප.ව. 14.30 - 15.00** | ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස සන්නිවේදන කෙටුම්පත ඉදිරිපත් කිරීම, කණ්ඩායම් ක්‍රියාකාරකම් පිළිබඳ හඳුන්වා දීම |
| **ප.ව. 15.00 - 15.30** | කණ්ඩායම් ක්‍රියාකාරකම: සන්නිවේදන අවශ්‍යතා හඳුනාගැනීම හා දේශගුණික විපර්යාස සන්නිවේදන ක්‍රමවේදයට අදහස් එක් කිරීම |
| **ප.ව. 15.30 - 15.45** | තේ විවේකය |
| **ප.ව. 15.45 - 16.15** | කණ්ඩායම් ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීම |
| **ප.ව. 16.15 - 17.00** | දේශගුණික විපර්යාස සන්නිවේදන ක්‍රමවේදය පිළිබඳ සාකච්ඡාව: දේශගුණික විපර්යාස පිළිබඳ ඵලදායී සන්නිවේදනයක් හා සමාජීය දැනුවත්භාවය |
| **ප.ව. 16.45 - 17.00** | ස්තුති කතාව |

# පාසල් දැනුවත් කිරීමේ වැඩසටහන

| | |
|---|---|
| **Venue:** | කමිටු ශාලාව B - ලෝටස් |
| **Date:** | 2018 ඔක්තෝබර් 19 |
| **Time:** | පෙ.ව 11.30 - ප.ව 4.30 |

වර්තමානයේ සිදුවන අධික නාගරිකරණයත් සමග ස්වභාවික පරිසරයට මිනිසාට සමීප වීමට ඇති හැකියාව හා අවස්ථාව සමාජයෙන් ගිලිහී යයි. මිනිසා හා ස්වභාවික පරිසරය අතර ඇති සමීප සබැඳියාව බිඳී යාම හේතුවෙන් හා අධික කාර්ය බහුල සමාජීය වටපිටාව හේතුවෙන් බිහිවන දරු පරපුර මානසික ආතතියට ගොදුරු වීම සුලභය.

මෙම වැඩසටහන පාසල් දරුවන් හා ගුරුභවතුන්ගේ ආකල්පමය වෙනස සඳහා ක්‍රියාත්මක කෙරේ. රටේ ජීවනාලිය බඳු දූ දරුවන් ස්වභාවික පරිසරයේ රිද්මය හඳුනන පරිසරයට ළබැඳි දරු පරපුරක් කිරීම මෙම වැඩසටහනේ අරමුණයි.

ශ්‍රී ලංකා රජය විසින් 2018 වසරේ ඔක්තෝබර් 19, 20 යන දින වල කොළඹදී සංවිධානය කරනු ලබන "ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්*" සම්මන්ත්‍රණයේ එක් අංගයක් ලෙස 2018 ඔක්තෝබර් 19 දින පාසල් සිසුන් හා ගුරු භවතුන් 400 කගේ සහභාගිත්වයෙන් මෙම වැඩමුළුව පැවැත්වීමට නියමිතය.

**වැඩසටහනේ අරමුණ:** පරිසරය හා සෞන්දර්යය පිළිබඳ සංවේදී අනාගත දරු පරපුරක් බිහිකිරීම තුළින් පරිසර සංරක්ෂණය

**තේමාව:** "මහ පොළවේ රිද්මය අහන්න එන්න" පාසල් සිසුන් සඳහා පරිසරය ආශ්‍රිත සෞන්දර්යාත්මක වැඩසටහන

**මාධ්‍ය:** සිංහල

**සංවිධානය:** මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ වන සම්පත් අංශය, වායු සම්පත් කළමනාකරණ හා ජාතික ඕසෝන් ඒකකය සහ අධ්‍යාපන පුහුණු හා පර්යේෂණ අංශය

| වේලාව | වැඩසටහන් විස්තරය |
|---|---|
| **පෙ.ව11.30** | ලියාපදිංචිය/ දිවා ආහාරය |
| **ප.ව1.00** | සැසියේ ආරම්භය |
| **ප.ව 1.15** | පිළිගැනීමේ කථාව හා අරමුණ පැහැදිලි කිරීම |
| **ප.ව 1.30** | සංගීත වැඩසටහනේ ආරම්භය |
| **ප.ව 3.30** | සාකච්ඡා වාරය |
| **ප.ව 4.00** | වැඩසටහන් නිමාව |

## දෙවන අන්තර්ජාතික ඛනිජ සම්මන්ත්‍රණය

| | |
|---|---|
| **Venue:** | කමිටු ශාලා A, ජැස්මින් |
| **Date:** | 2018 ඔක්තෝබර් 20 |
| **Time:** | පෙ.ව 8.30 - ප.ව 8.00 |

ඛනිජ ක්ෂේත්‍රයේ අභියෝගාත්මක ආර්ථික හා පාරිසරික සැකසුම් වලට ප්‍රතිචාර වශයෙන් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ඒකාබද්ධ ශ්‍රී ලංකාවේ ඛනිජ අංශයේ අනාගත අවස්ථා හා අභියෝග සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්* 2017 වැඩසටහනට සමගාමීව සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. මෙම සම්මන්ත්‍රණයේ දී ඛනිජ ආශ්‍රිත පර්යේෂණ රාශියක් ශ්‍රී ලංකාව පුරා විසිරී පවතින බව හඳුනා ගැනීමට හැකි වූ අතර පර්යේෂකයන්, විද්වතුන් හා කර්මාන්තකරුවන් තුල ඒ පිළිබඳව උනන්දුවක් ඇති කිරීමට හැකිවිය. එමෙන්ම මෙම සම්මන්ත්‍රණයේ දී ඉදිරිපත් වූ පර්යේෂණ කිහිපයක් මේ වන විට රටේ ආර්ථිකයට දායක කර ගැනීමට හැකි වී ඇති අතර අනෙක් පර්යේෂණ හා ඉදිරි පර්යේෂණ කටයුතු සඳහා දායක කරගෙන ඇත.

මෙම සම්මන්ත්‍රණයේ සාර්ථකත්වය හා වැදගත්කම අවබෝධකර ගනිමින් මෙවරත් ශ්‍රී ලංකා නෙක්ස්ට් ප්‍රදර්ශනයට සමගාමීව 2018 ඔක්තෝම්බර් මස 20 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණශාලාවේදී ඛනිජ සම්මන්ත්‍රණය පැවැත්වීමට නියමිතව ඇත. මෙහි දී දේශීය ඛනිජ සම්පත ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව හඳුනාගනිමින් අගය එකතු කිරීමට ඇති ශක්‍යතාවන් පෙන්වා දෙමින් සංවේදී පරිසර තත්වයන් යටතේ සහ-භාවය පවත්වා ගනිමින් තිරසර, සාධනීය හා ප්‍රතිඵලදායී ඛනිජ කර්මාන්තයක පැවැත්මට අවශ්‍ය ප්‍රතිපත්තිමය හා තාක්ෂණික කරුණු විමසුමට භාජනය කිරීම 2018 ඛනිජ සම්මන්ත්‍රණයෙන් අපේක්ෂා කෙරේ.

**මාධ්‍යය:** ඉංග්‍රීසි

**සහභාගීත්වය:** දෙස් විදෙස් ආයෝජකයින්, අපනයනකරුවන්, නිෂ්පාදකයින්, ශිෂ්‍යයින්, විද්වතුන්, පර්යේෂකයින් හා විශේෂඥයන් (300 පමණ පිරිස)

**සංවිධානය:** භූමි සම්පත් අංශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය/ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

**වැඩිදුර තොරතුරු සඳහා:**

- කුමුදිනි පරණවිදානගේ මහත්මිය

භූමි සම්පත් අංශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය (+94 (0) 77 940 7498)

- ගිම්හානි සමරසේන මහත්මිය

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය (+94 (0) 71 990 5636)

නාය පත්‍රය: දෙවන අන්තර්ජාතික ඛනිජ සම්මන්ත්‍රණය

| වේලාව | වැඩසටහන් විස්තරය |
|---|---|
| පෙ.ව. 8.30 - 9.00 | ලියාපදිංචිය |
| පෙ.ව. 9.00 - 9.15 | ආරම්භක සැසිය<br>පොල්තෙල් පහන දැල්වීම හා ජාතික ගීය ගායනය |
| පෙ.ව. 9.15 - 9.20 | පිළිගැනීමේ කථාව: අසේල ඉද්දවෙල මහතා, සභාපති, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය |
| පෙ.ව. 9.20 - 9.50 | ප්‍රධාන දේශනය: ආචාර්ය ක්‍රිස්ටීන් ජී. ඩෙරොෂියර් මහතා - ජ්‍යෙෂ්ඨ උපදේශක, කැනඩාවේ සිලෝන් ග්‍රැෆයිට් සහ සර්න්කොන් ඩිවලොප්මන්ට් (පුද්) සමාගම ශ්‍රී ලංකාව |
| පෙ.ව. 9.50 - 10.10 | විශේෂ දේශනය: ඛනිජ ගවේෂණයේ නූතන ප්‍රවණතාවයන් - ආචාර්ය C.H.E.R. සිරිවර්ධන මහතා - අධ්‍යක්ෂ ජනරාල් - භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය |
| පෙ.ව. 10.10 - 10.30 | උමා ඔය ව්‍යාපෘතිය: ඩේවිඩ් ලීස් මහතා, ප්‍රධාන ඉංජිනේරු සුපරික්ෂක, ඇම්බර්ග් ඉංජිනේරු ඒජී |
| පෙ.ව. 10.30 - 10.40 | ප්‍රධාන ආරාධිත අමුත්තා විසින් සභාව ඇමතීම: ගරු. නියෝජ්‍ය අමාත්‍ය අජිත් මාන්නප්පෙරුම මහතා, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය |
| පෙ.ව. 10.40 - 10.45 | ස්තූති කථාව: අජිත් සිල්වා, අධ්‍යක්ෂ (භූමි සම්පත්), මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය |
| පෙ.ව. 10.45 - 11.00 | තේ විවේකය |
| පෙ.ව. 11.00 - ප.ව. 1.00 | තාක්ෂණික සැසිය 01 - භූ සම්පත්<br>ආරාධිත දේශන, පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම්, ගැටලු සාකච්ඡා කිරීම |
| ප.ව. 1.00 - 1.30 | දිවා ආහාරය |
| ප.ව. 1.30 - 3.30 | තාක්ෂණික සැසිය 02 - ආර්ථික ප්‍රතිලාභ<br>ආරාධිත දේශන, පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම්, ගැටලු සාකච්ඡා කිරීම |
| ප.ව. 3.30 - 3.45 | තේ විවේකය |
| ප.ව. 3.45 - 5.45 | තාක්ෂණික සැසිය 03 - පාරිසරික බලපෑම්<br>ආරාධිත දේශන, පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම්, ගැටලු සාකච්ඡා කිරීම |
| ප.ව. 5.45 - 6.00 | ත්‍යාග ප්‍රධානෝත්සවය |
| ප.ව. 6.00සිට | වැඩසටහන් නිමාව හා රාත්‍රී සංග්‍රහය |

## "සොබා වලන සිතුවම්" කෙටි චිත්‍රපට උළෙල ත්‍යාග ප්‍රදානෝත්සවය

| | |
|---|---|
| **Venue:** | ලැවැන්ඩර් ශාලාව |
| **Date:** | 2018 ඔක්තෝබර් 19 |
| **Time:** | ප.ව 12.30 - ප.ව 4.00 |

ලෝක පරිසර දිනයට සමගාමීව පවත්වනු ලබන "සොබා වලන සිතුවම්" කෙටි චිත්‍රපට තරඟාවලිය 2014 වර්ෂයේ සිට මේ දක්වා නොකඩවා පවත්වනු ලබයි. මෙම කෙටි චිත්‍රපට තරඟාවලිය පැවැත්වීමේ ප්‍රධාන අරමුණ වන්නේ තරුණ සිනමාකරුවන්ගේ නිර්මාණ තුළින් පරිසර සංරක්ෂණය පිළිබඳ ආකල්පමය වෙනසක් ඇතිකරමින් සාධනීය සමාජ කතිකාවතක් ගොඩනැංවීමයි. ඒ අනුව 2018 වර්ෂයේදී ද මෙම තරඟාවලිය සංවිධානය කළ අතර පරිසරය සම්බන්ධ ඕනෑම තේමාවක් ඔස්සේ නිර්මාණ ලබා ගැනීම සිදු කරන ලදි.

මෙම තරඟයේ ජයග්‍රහකයන් තෝරා ගැනීම ක්ෂේත්‍රයේ ප්‍රවීණ විද්වත් මණ්ඩලයක් විසින් සිදු කරන අතර එම ජයග්‍රාහකයන් ඇගයීම සඳහා සම්මාන, සමරු තිළිණ, සහතික පත්‍ර හා මුදල් ත්‍යාග පිරිනැමීම "ශ්‍රී ලංකා නෙක්ස්ට් - *නීල හරිත යුගයක්*" වැඩසටහනට සමගාමීව සංවිධානය කරනු ලැබේ.

**අපේක්ෂිත සහභාගීවන්නන්:** රාජ්‍ය නිලධාරීන්, විනිශ්චය මණ්ඩලය, ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සහ තරඟය සඳහා සහභාගී වූ සියළුම තරඟකරුවන්ගෙන් සමන්විත 150ක පමණ පිරිසක්.

**න්‍යාය පත්‍රය: "සොබා වලන සිතුවම්" කෙටි චිත්‍රපට උළෙල ත්‍යාග ප්‍රදානෝත්සවය**

| වේලාව | වැඩසටහන් විස්තරය |
|---|---|
| **ප.ව. 12.30** | සහභාගීවන්නන් ලියාපදිංචි කිරීම |
| **ප.ව. 1.00** | තෝරාගත් කෙටි චිත්‍රපට ප්‍රදර්ශනය කිරීම |
| **ප.ව. 1.45** | ආරාධිතයින් අසුන් ගැන්වීම |
| **ප.ව. 2.00** | පොල්තෙල් පහන දැල්වීම. |
| **ප.ව. 2.10** | පිළිගැනීම සහ අරමුණ පැහැදිලි කිරීම:<br>එම්. පී. ඩී. යූ. කේ. මාපා පතිරණ මයා - අතිරේක ලේකම් (පරිසර ව්‍යාපෘති හා අධ්‍යාපන පුහුණු) |
| **ප.ව. 2.20** | "සොබා වලන" කෙටි චිත්‍රපටි තරගාවලියේ ජයග්‍රාහී නිර්මාණ ප්‍රදර්ශනය හා එම නිර්මාණ පිළිබඳ විද්වත් කතිකාවත<br>මෙහෙයවීම - විනිශ්චය මණ්ඩලයේ සාමාජිකයන් විසින් |
| **ප.ව. 3.00** | උත්සවයේ ප්‍රධාන ආරාධිතයින් සභාව ඇමතීම. |
| **ප.ව. 3.20** | "සොබා වලන" කෙටි චිත්‍රපටි තරගාවලියේ ජයග්‍රාහී නිර්මාණ සඳහා සම්මාන සහ සහතික පත්‍ර පිරිනැමීම. |
| **ප.ව. 3.50** | ස්තුති කතාව:<br>කේ.එස්.අප්සරා මෙන්ඩිස් මහත්මිය - අධ්‍යක්ෂ (අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ) |
| **ප.ව. 4.00** | වැඩසටහන් නිමාව |

| | |
|---|---|
| **Venue:** | ඕකිඩ් ශාලාව |
| **Date:** | 2018 ඔක්තෝබර් 19 |
| **Time:** | ප.ව 1.00 - ප.ව 5.00 |

ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ සුවිශේෂී ස්ථානයක පිහිටි එමෙන්ම නාවික හා සමුද්‍රීය කටයුතු උරුමයක් දරණ දූපත් රාජ්‍යකි. මෙම සුවිශේෂී පිහිටීම නිසාම ලෝකයේ අන්තර් නාවික වෙළඳ හුවමාරු කටයුතු වලට දායකත්වය ලබාදේ. එබැවින් මෙම හේතුව නිසාම නෞකා ක්ෂේත්‍රයේ සුවිශේෂී ස්ථානයක් දරමින් ලෝකයේ නාවික හා ගුවන් කටයුතු ක්ෂේත්‍රයන්හි කේන්ද්‍රස්ථානයක් ලෙස දක්වා ඇත.

මෙම තත්වය රටෙහි ආර්ථික වර්ධනය කෙරේ කෙලින්ම බලපාන අතර, නාවුක හා වරාය කටයුතු නිරන්තරයෙන්ම සාගර පරිසරයේ ස්ථායීතාව, හා පැවැත්ම, සමාජීය ආර්ථික කටයුතු කෙරේ බලපායි. මෙම විෂය පථය ආශ්‍රිතව පැන නඟින ගැටළු පිළිබඳව විශේෂඥයින් අතර කථිකාවතක් ඇති කරමින් තිරසාර සංවර්ධනය කෙරෙහි විසඳුම් හඳුන්වා දීමටත් අවශ්‍ය කරන ප්‍රතිපත්ති සහ ක්‍රමවේදයන් හඳුන්වා දීමට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශය සමඟ ඒකාබද්ධව තැබූ එක් පියවරකි. "ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්*" 2018 සාගර පරිසරය පිළිබඳ විශේෂඥ සංවාදය නාවික ක්ෂේත්‍රයේ සංවර්ධනය නිල් ආර්ථිකයක් කරා යන තේමාව ඔස්සේ, සාගර විෂය පථය පිළිබඳ විශේෂඥයින් අතර සංවාදාත්මක කතිකාවතකට ඉඩ සලසයි.

මෙම විද්‍යාත්මක සංවාදය ප්‍රධාන ආරාධිත දේශනයකින් සහ ප්‍රධාන සැසිවාර 5 ක් ඔස්සේ සාකච්ඡා කෙරෙන අතර, එම සෑම සැසිවාරයකින්ම පසුව සංවාදාත්මක සාකච්ඡාවකට අවස්ථාව සලසා දී ඇත.

වැඩසටහන සඳහා ඇතුලත් කර ඇති ප්‍රධාන සැසිවාරයන් නම් ශ්‍රී ලංකාව ආශ්‍රිත නාවුක ක්ෂේත්‍රය ආශ්‍රිතව ආර්ථික වර්ධනය, නාවික කටයුතු සමග සාගර තල්මසුන්/ ක්ෂීරපායී අතර ගැටලුකාරී තත්වය හා ඒ සඳහා විසඳුම්, නෞකා හා වරාය කටයුතු සංවර්ධනය, තෙල් හා රසායනික විසිරුම් ආශ්‍රිතව පැන නැගී ඇති අවධානම් තත්වය සහ එයට විසඳුම් නෞකා හා වරාය කටයුතු හේතුවෙන් ඇතිවන වායු දූෂණය සහ හඳුනාගත් බලශක්ති කාර්යක්ෂමතාව, සහ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු, ශ්‍රී ලාංකීය මුහුදු ආශ්‍රිත තෙල් සහ ස්වාභාවික වායු සම්පත් පිළිබඳව අනාගත ඉදිරි දර්ශනය යන සැසිවාරයන් වේ.

මෙම වැඩසටහන ශ්‍රී ලංකා සාගර පාරිසරික සංසදය හා එක්ව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මඟින් සංවිධානය කරනු ලබයි.

**තේමාව:** "*නාවික ක්ෂේත්‍රයේ සංවර්ධනය තුලින් නිල් ආර්ථිකයක් කරා*"

**වැඩ සටහනේ අරමුණු:**

- මෙම විෂය පථය ආශ්‍රිතව පැන නඟින ගැටළු පිළිබඳව විශේෂඥ කථිකාවතක් ඇති කරමින් තිරසාර සංවර්ධනය කෙරෙහි විසඳුම් හඳුන්වාදීම.
- තිරසාර සාගර පරිසරයක් පවත්වා ගැනීම සඳහා හඳුනාගත් ගැටළු කෙරේ විසඳුම් සොයා ගැනීම.

**ඉලක්කගත කණ්ඩායම් සහ ප්‍රමාණය**: පර්යේෂකයින්, අධ්‍යාපනවේදීන්, සැලසුම්කරුවන්, සාගර පරිසරය පිළිබඳ ප්‍රවීණයන් සමන්විත 150 ක පමණ පිරිසක්

**සම්පත් දායකයින්:** විශ්වවිද්‍යාලයීය වෘත්තීයවේදීන් සහ සාගර පරිසරය පිළිබඳ ප්‍රවීණයන්

**වැඩිදුර තොරතුරු සඳහා:**

- තලතා රණසිංහ මහත්මිය (+94 (0) 11 267 2757 / +94 (0) 71 818 8866, mepa.amw@gmail.com)
- සධනි අබේරත්න මහත්මිය (+94 (0) 11 267 2757, mepa.amw@gmail.com)

| වේලාව | වැඩසටහන් විස්තරය |
|---|---|
| 13.00 - 13.30 | සහභාගීවන්නන් ලියාපදිංචිය |
| 13.00 | අමුත්තන් සහ සහභාගීවන්නන් ශ්‍රවනාගාරයේ අසුන් ගැන්වීම |
| 13.35 | ප්‍රධාන ආරාධිත අමුත්තාගේ සම්ප්‍රාප්තිය<br>පොල් තෙල් පහන දැල්වීම/ ජාතික ගීය ගායනය |
| 13.35 - 13.40 | පිළිගැනීමේ කථාව - සභාපති (සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය) රියර් අද්මිරාල් රෝහණ පෙරේරා (විශ්‍රාමික) ආර්එස්පී. වීඑස්වී. යුඑස්පී |
| 13.40 - 13.50 | ප්‍රධාන ආරාධිත අමුත්තාගේ කතාවස්ටුවර්ඩ් මැගිනිස් (IUCN) |
| 13.50 - 14.00 | ආරාධිත අමුත්තාගේ කතාවලේකම්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය |
| විද්‍යාත්මක සැසිය I | නාවික ක්ෂේත්‍රය හා ආර්ථික සංවර්ධනය - ශ්‍රී ලාංකීය සන්ධර්භය තුලින් |
| 14.00 - 14.15 | දේශක - රොහාන් මාසිකෝරාල මහතා<br>සභාපති, ජාතික අපනයන කාර්යය උපායික උපදේශක මණ්ඩලය (අපනයන සංවර්ධන මණ්ඩලය) |
| 14.15 - 14.30 | විද්‍යාත්මක සංවාදය |
| විද්‍යාත්මක සැසිය II | ශ්‍රී ලාංකේය ජල තීරයේ සිදුවන තල්මසුන් සහ නාවික ක්ෂේත්‍රයේ ගැටුම් සහ ඒ පිළිබඳව විසඳුම් |
| 14.30 - 14.45 | දේශක - ආශා ඩි වොස් - සාගර ජීව විද්‍යාඥ |
| 14.45 - 15.00 | විද්‍යාත්මක සංවාදය |
| විද්‍යාත්මක සැසිය III | නෛතික විශ්ලේශණය - තෙල් හා රසායනික ද්‍රව්‍ය විසිරීම සහ වරාය සංවර්ධන කටයුතු ආශ්‍රිතව සිදුවන සාගර පාරිසරික ගැටළු පිලිබඳව නෛතික විශ්ලේශණය |
| 15.00 - 15.15 | දේශක - ආචාර්යය ඩී. මාලික ගුණසේකර<br>පීඨාධිපති (කළමණාකරණය, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය) |
| 15.15 - 15.30 | විද්‍යාත්මක සංවාදය |
| විද්‍යාත්මක සැසිය IV | නාවික සහ වරාය කටයුතු ආශ්‍රිතව සිදුවන වායු දූශණය සහ බලශක්ති කාර්යක්ෂමතා විසඳුම් |
| 15.30 - 15.45 | දේශක - ජගත් ගුණසේකර මහතා<br>කළමණාකරණ මෙහෙයුම් (සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය) |
| 15.45 - 16.00 | විද්‍යාත්මක සංවාදය |
| විද්‍යාත්මක සැසිය V | ශ්‍රී ලාංකීය මුහුදු ආශ්‍රිත තෙල් සහ ස්වාභාවික වායු සම්පත් පිලිබඳව අනාගත ඉදිරි දර්ශනය |
| 16.00 - 16.15 | දේශක - ඩී. ටී. කේ. ප්‍රීති විතානගේ<br>අධ්‍යක්ෂිකා , ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය |
| 16.15 - 16.30 | විද්‍යාත්මක සංවාදය |
| 16.30 - 16.45 | ඉදිරි ගමන් මග |
| 16.45 - 17.00 | සංවාදයේ නිමාව සහ තේ පැන් සංග්‍රහය |

## තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය පිළිබඳ ජාතික කතිකාවත

| | |
|---|---|
| **Venue:** | ඕකිඩ් ශාලාව |
| **Date:** | 2018 ඔක්තෝබර් 20 |
| **Time:** | පෙ.ව 9.00 - ප.ව 5.00 |

යුරෝපා සංගමයේ මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක වන SWITCH ASIA තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය (SCP) ශ්‍රී ලංකාව සඳහා ජාතික ප්‍රතිපත්ති සහාය සංරචක (NPSC) යනු 2015 ජනවාරි මස ආරම්භ කරන ලද වසර 04 ක ව්‍යාපෘතියකි.

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ඉල්ලීමක් පරිදි මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාව වෙත ප්‍රදානය කර ඇත්තේ "තාක්ෂණික සහාය වැඩසටහනක්" ලෙසය. තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය ක්‍රියාත්මක කිරීම සඳහා සමස්ත ප්‍රතිපත්ති හා ආයතනික රාමුව ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම පිණිසය.

ව්‍යාපෘතිය ආරම්භයේ සිටම, අදාළ උපදේශනයන් හා අධ්‍යයනයන් ගණනාවක්ම සිදුකළ අතර, බොහෝ ආයතනයන් සහ පුද්ගලයින්ගේ සහභාගීත්වයෙන් විවිධ ක්‍රියාකාරකම් සිදු කර ඇති අතර, ව්‍යාපෘතියේ විශේෂඥ කණ්ඩායම මූලික ප්‍රවීණයන්ගේ ද සහයෝගය ඇතිව තිරසර පරිභෝජනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය වැඩිදියුණු කිරීමත්, තිරසර පරිභෝජන හා නිෂ්පාදන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමත් සඳහා සම්බන්ධීකරණ යාන්ත්‍රණ කෙටුම්පතක් සකස් කිරීම ජාතික ප්‍රතිපත්තීන් සඳහා සම්මත ආකෘතියක්, තිරසර පරිභෝජනය පිළිබඳ අධ්‍යයන සැලැස්මක්, තිරසර පොදු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, තිරසර සම්පත් නිෂ්පාදනය සඳහා මූල්‍යමය උපකරණ, තිරසර පරිභෝජනය නිෂ්පාදනය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම, ආහාර සහ පාන උප ක්ෂේත්‍ර වල මූලික සමීක්ෂණ හා උපදේශන කටයුතු පාරිසරික නව්‍යතා වලට ආරම්භයක් සහ පාරිසරික ලේබල් කිරීම පිළිබඳ මූලික සමීක්ෂණ පැවැත්වීම සිදු කරන ලදී. ආහාරපාන කර්මාන්තයේ උප ක්ෂේත්‍ර වන කිරි, සහල් හා තේ නිෂ්පාදනයන්හි සැකසීම සහ ඒ ඒ අංශයන්ට සුවිශේෂී තිරසර පරිභෝජනය හා නිෂ්පාදන සන්දර්භය තුළ ක්‍රියාකාරී සැළසුම් සකස් කිරීමද මේ හරහා සිදුකර ඇත.

ව්‍යාපෘතියේ යොමු කිරීම් අනුදේශ (TOR) වලට අනුකූලව තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය පිළිබඳ ජාතික වට මේස සාකච්ඡාවක් සහ පාරිසරික නව්‍යතා ප්‍රදර්ශනයක් ව්‍යාපෘතිය දියත් වන අවස්ථාවන්හිදී පැවැත්වීමට නියමිත වීම වඩාත් යෝග්‍ය වේ.

ව්‍යාපෘතියේ අවසන් අදියර තුළ ව්‍යාපෘතියේ ප්‍රධාන ව්‍යාපෘති නිමැවුම් (Major Project Deliverables) බොහෝමයක් සම්පූර්ණ කර ඇති අතර, එම ව්‍යාපෘති නිමැවුම් ව්‍යාපෘතියේ ප්‍රධාන පාර්ශ්වකරුවන් වෙත ඉදිරිපත් කිරීම සඳහා ඉදිරි මාවත තීරණය කිරීමටත් සුදුසු කාලය එළඹ තිබේ. තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය පිළිබඳ වට මේස සාකච්ඡාව හා අදාළ පාර්ශ්වීය ක්‍රියාකාරකම් (Side events) ඉහත අවශ්‍යතා සපුරාලීම සඳහා ද වැදගත්ය.

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් සංවිධානය කරනු ලබන ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්* 2018 වැඩසටහන ඔක්තොම්බර් 19-20 යන දෙදින තුළ, කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය ශාලාවේ දී තෙවන වරටත් පැවැතිවීමට නියමිතය.

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ඉල්ලීම මත, ව්‍යාපෘතිය පසුගිය වසර 02 තුළ ඉතා සාර්ථක ලෙස ඒ සඳහා සහභාගී විය.

මෙම වසරේ දී, 2018 ඔක්තෝම්බර් 20 වන සෙනසුරාදා එනම් ප්‍රදර්ශනයේ දෙවන දිනට සහභාගී වන ලෙස මහවැලි මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ඉල්ලීමක් කර ඇති අතර, ඒ සඳහා ඕකිඩ් කමිටු ශාලාව වෙන් කර ඇත.

ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්* වැඩසටහනට විවිධ සමාජ ස්ථරයන්හි විශාල පිරිසක් සහභාගී වී ඇති බැවින් යුරෝපා සංගමයේ SWITCH ASIA මැදිහත් වීම සහ තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමට එය දක්වන සහයෝගය හා ප්‍රගතිය එළි දැක්වීමට වඩා හොඳ අවස්ථාවක් සපයයි.

**අරමුණු:**

- තිරසර පරිභෝජන හා නිෂ්පාදන ජාතික වටමේස සාකච්ඡාවෙහි හා පාර්ශ්වීය ක්‍රියාකාරකම් වල පරමාර්ථ පහත පරිදි වේ.
- 2019 ජනවාරි මාසයේදී ව්‍යාපෘතිය නිම කිරීමට පෙර පාර්ශවකරුවන්ගේ පුළුල් කණ්ඩායමට ව්‍යාපෘතියේ ප්‍රධාන නිමැවුම් බෙදාහැරීම.
- තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය ප්‍රයත්න ඉදිරියට ගෙන යාම සඳහා අවශ්‍ය එකඟතාවන් ලබාගැනීම.
- යුරෝපා සංගමය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ SWITCH ASIA ව්‍යාපෘතිය පිළිබඳ දෘෂ්‍ය භාවය ඉහළ නැංවීමේ ක්‍රමෝපායක් ලෙස.

**ඉලක්ක ගත සහභාගිවන්නන්:**

ජාතික මට්ටමේ වටමේස වැඩමුළුවට සහභාගීවීම සඳහා ආරාධනා පත්‍රයක් මගින් ආරාධනා කළ යුතු අතර පහත දැක්වෙන කාණ්ඩ නියෝජනය වන පාර්ශ්වකරුවන් 150-160 අතර ප්‍රමාණයක් සහභාගීවේ.

- ශ්‍රී ලංකා රජයේ උසස් නිලධාරීන් (සමාරම්භක අවස්ථාව සඳහා)
- යුරෝපා සංගමයේ සාමාජික රටවල නියෝජිතයන් (සමාරම්භක අවස්ථාව සඳහා)
- ව්‍යාපෘති නියාමන කමිටුවේ සාමාජිකයන්
- අන්තර් ආයතනික විශේෂඥ වැඩ කණ්ඩායම් සාමාජිකයන්
- තිරසර පරිසර හා නිෂ්පාදන කේන්ද්‍රීය ස්ථානයන්හි නිලධාරීන්
- ව්‍යාපෘතිය ආරම්භයේ සිටම උපදේශක සැසි වලට සම්බන්ධ වු සියළු පාර්ශවකරුවන්
- තිරසර පරිභොජනය හා නිෂ්පාදනය පිළිබඳ පුහුණු කරුවන් පුහුණු කිරීම සඳහා සහභාගීවූ සියළු සාමාජිකයන්
- සියළුම තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය පිළිබඳ ශිෂ්‍යත්ව ලාභීන්
- තිරසර පරිභොජනය හා නිෂ්පාදනය පිළිබඳ දැනුවත් කිරීමේ/ පුහුණු වැඩසටහන් පවත්වන ලද සියළුම පාර්ශව කරුවන්ගේ සම්බන්ධීකරණ ස්ථාන
- මාධ්‍යවේදීන්

**ප්‍රධාන දේශක:**

එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ කලාපිය සම්බන්ධිකාරක එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ සම්පත් කාර්යක්ෂමතාව පිලිබඳ ආසියා පැසිපික් කලාපිය සම්බන්ධීකාරක වන මුස්ටක් මෙමොන් මහතා ප්‍රධාන දේශකතුමා වශයෙන් මෙම අවස්ථාවට සහභාගී වේ.

පරිසර හිතකාමී නවෝත්පාදන, ආහාර අපතේ යාම අඩු කිරීම හා පුළුල් නිෂ්පාදන වගකීම යන තේමාවන් යටතේ පාර්ශවීය ක්‍රියාකරකම් (Side Events) තුනක් පැවැත්වේ.

වැඩිදුර තොරතුරු සඳහා:

- ගාමිණී සේනානායක මහතා, ප්‍රධාන විශේෂඥ, SCP ව්‍යාපෘතිය
  (+94 (0) 77 483 5163, gaminisn@gmail.com)
- නලිනි කොහොවල මෙනවිය, සහකාර අධ්‍යක්ෂ, පරිසර සැලසුම් හා ආර්ථික අංශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
  (+94 (0) 71683370, nalinikohowa@yahoo.com)

න්‍යාය පත්‍රය: තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය පිලිබඳ ජාතික කතිකාවත

| වේලාව | වැඩසටහන් විස්තරය |
|---|---|
| **0900 - 0930** | ලියාපදිංචි කිරීම |
| **0930 - 1030** | සමාරම්භය |
| **0945 - 1005** | ප්‍රධාන දේශනය (Key Note Speech): මුස්ටක් මෙමොන්, කලාපිය සම්බන්ධීකාරක, UNEP |
| **1005 - 1030** | සභාව ඇමතීම - යුරෝපා සංගමය: ෆ්‍රන්ක් හෙස් මහතා, සහයෝගීතා ප්‍රධානී<br>SCP වෙබ් අඩවිය ආරම්භ කිරීම<br>ප්‍රධාන අමුත්තා විසින් සභාව ඇමතීම: අනුර දිසානායක මහතා, ලේකම්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය |
| **1030 - 1100** | තේ පැන් සංග්‍රහය |
| **1100 - 1120** | දේශගුණ විපර්යාස හා තිරසර පරිභෝජනය හා නිෂ්පාදන ක්‍රියාකාරකම් තුලින් තරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම උදෙසා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ දායකත්වය: ධම්මිකා විජයසිංහ, අධ්‍යක්ෂ, පරිසර සැලසුම් හා ආර්ථික අංශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ පරිසර දූෂණ හා රසායනික කළමනාකරණ අංශය |
| **1120 - 1140** | ශ්‍රී ලංකාව තුල තිරසර නිෂ්පාදනය හා පරිභෝජනය සඳහාද SWITCH ASIA ව්‍යාපෘතියේ දායකත්වය: ඉංජිනේරු ගාමිණී සේනානායක මහතා ප්‍රධාන විශේෂ {SWITCH Asia SCP} ව්‍යාපෘතිය |
| **1140 - 1200** | පාරිභෝගික දැනුවත්භාවය පිළිබඳ සමීක්ෂණ ප්‍රතිඵල: සමන්ත කුමාරසේන මහතා, ප්‍රධාන විධායක නිලධාරී, NCPC |
| **1200 - 1220** | තිරසාර නොවන ආහාර පුරුදු වල සෞඛ්‍යමය බලපෑම්: වෛද්‍ය ඉනෝකා සුරවීර, උපදේශක, සෞඛ්‍ය අමාත්‍යාංශය |
| **1220 - 1240** | අපද්‍රව්‍ය සම්පතක් ලෙස: රවී ද සිල්වා මහතා (පරිසර කළමනාකරණ උපදේශක) |
| **1240 - 1300** | ආහාර අපතේ යාම අඩු කිරීම - පළාත් ක්‍රියාකාරකම්: නීලකාන්ත් වන්නිනායක මහතා ප්‍රධාන විධායක අධ්‍යක්ෂ, කාර්මික සේවා කාර්යංශය (ISB) |
| **1300 - 1400** | දිවා විවේකය |
| **1400 - 1420** | පොලිතින් භාවිතය අවම කිරීම සඳහා FMCG අංශයේ/ සුපිරි වෙළඳසැල් වල උපායමාර්ග: රුවන් කුමාර මහතා, ප්‍රධාන තත්ත්ව සහතික සහ නියාමන කටයුතු පාරිභොගික ආහාර අංශය හා සහකාර උප සභාපති - ජෝන් කීල්ස් අයතනය |
| **1420 - 1440** | වගකිවයුතු පරිභෝජනය - සංචාරක කර්මාන්තයේ සිද්ධි අධ්‍යනයක්: සශිකා කලුවහේවා මිය, සහකාර කළමණාකරු ජෙට් වින්ග්ස් හෝටලය - අධ්‍යක්ෂ ඉන්ජිනේරු |
| **1440 - 1500** | වගකීමෙන් යුතු පරිභොජනය - ඇගළුම් කර්මාන්තයේ සිද්ධි අධ්‍යනය (නිශ්චිත තේමාව): ශාරිකා සේනානායක මිය, අධ්‍යක්ෂ, තිරසාර, MAS හෝල්ඩින්ග්ස් |

| | |
|---|---|
| **1500 - 1520** | පුළුල් නිෂ්පාදන වගකීම - ප්ලාස්ටික් බොතල් ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියේ, ව්‍යාපෘති විශේෂඥ කණ්ඩායම මගින් කරන ලද සිද්ධි අධ්‍යයනයක්: ලක්ෂ්මන් මදුරසිංහ මහතා, මහජන කටයුතු, සන්නිවේදන හා තිරසාර කළමණාකාර, කොකාකෝලා අයතනය |
| **1520 - 1540** | තිරසර පරිභෝජනය සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ යෙදවුම් (බැංකුවක් මගින් සිදුකරන ලද අධ්‍යනය): පසන් මනුකිත් මහතා, තොරතුරු තාක්ෂණ ප්‍රධානී, සම්පත් බැංකුව |
| **1540- 1600** | තිරසර පරිභෝජනය සඳහා වෙනසක නියමුවන් ලෙස පාසැල් ළමුන්: කුන්ඩසාලේ මහවත්ත මහා විද්‍යාලය හා හොරණ සාගර පලන්සූරිය මධ්‍ය මහා විද්‍යාලයේ පාසල් ළමුන් |
| **1600 - 1620** | ශ්‍රී ලංකාවේ තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය සඳහා ඉදිරි පියවර: මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය |
| **1620 -1630** | සමාප්තිය සටහන් කිරීම |
| **1630 - 1700** | තේ පැන් සංග්‍රහය |

## දේශගුණ විපර්යාස පිළිබඳ ගෝලීය තරුණ සංසදය

**Venue:** ටියුලිප් ශාලාව

**Date:** 2018 ඔක්තෝබර් 20

**Time:** පෙ.ව 9.00 - ප.ව 5.00

දේශගුණික විපර්යාස පිළිබඳ තරුණ සංසදය, UNFCCC ක්‍රියාවලියේ දේශගුණික විපර්යාසයන්ට එරෙහිව සිදුකරනු ලබන ක්‍රියාකාරකම් බලාත්මක කිරීම (Action for Climate Empowerment) යටතේ දේශගුණික විපර්යාස සඳහා ක්‍රියාමාර්ග ගැනීමට තරුණ තරුණියන් උනන්දු කිරීම හා බලගැන්වීම පිළිබඳව අවධානය යොමු කරමින් තුන්වන වරටත් සංවිධානය කරනු ලබයි.

**මෙම සංසදයේ අරමුණු:**

- ජාතික, අන්තර්ජාතික සහ දේශගුණික විපර්යාස ක්‍රියාවලියට තරුණයින් සහභාගී කරවීම
- ශක්‍යතා වර්ධනය සහ නිපුණතා සංවර්ධනය තුළින් තරුණයින් බලගැන්වීම
- දේශගුණික විපර්යාසවල බලපෑම් පිළිබඳ තරුණයන් අතර දැනුවත්භාවය ඇති කිරීම
- ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම තුළින් තරුණයින්ට දේශගුණික විපර්යාස වලට එරෙහිව ක්‍රියාකිරීමට දිරිගැන්වීම

**සහභාගිවන්නන්:** ජාතික හා අන්තර්ජාතික වශයෙන් අයදුම්පත් ක්‍රියාවලියක් හරහා සහ විෂය මූලික ගැටලුවක් මත ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කිරීම මත තෝරාගත් තරුණ තරුණියන් 35 දෙනෙක් පමණ

**සංවිධානය:** මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා දේශගුණික විපර්යාස ලේකම් කාර්යාලය, SLYCAN Trust, Humane Society International

**මූල්‍යමය දායකත්වය:** SLYCAN Trust, Humane Society International ආයතනය සහ තාක්ෂණික දායකත්වය Good Market, Venture Frontier Sri Lanka, ජාත්‍යන්තර රතු කුරුස සංගමය සහ රතු අඩසඳ සංගමය, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ කාබන් උපදේශන සමාගම

**වැඩිදුර තොරතුරු සඳහා:**

- වොසිතා විජේනායක මහත්මිය, විධායක අධ්‍යක්ෂිකා, SLYCAN Trust ආයතනය (vositha@slycantrust.org/ info@slycantrust.org)

| වේලාව | වැඩසටහන් විස්තරය |
|---|---|
| 0830 - 0900 | ලියාපදිංචි කිරීම |
| 0900 - 0915 | පිළිගැනීමේ කතාව: ආචාර්ය සුනිමල් ජයතුංග මහතා, අධ්‍යක්ෂක, ශ්‍රී ලංකා දේශගුණික විපර්යාස ලේකම් කාර්යාලය |
| 0915 - 0945 | පළමු සැසිය : 2017 තරුණ සංසදයට සහභාගීවූවන්ගේ ව්‍යාපෘති වල ප්‍රගතිය සහ වත්මන් තත්වය<br>○ කුමුදු ආරියවංශ මිය<br>○ හශාන්ති කුරේ මිය<br>○ ජයන්තන් අමලනාන් මහතා |
| 0945 - 1030 | දෙවන සැසිය: දේශගුණික විපර්යාස වලට එරෙහිව තරුණයන් පෙලගැස්වීම, බලගැන්වීම සහ UNFCCC ක්‍රියාවලිය: වොසිතා විජේනායක මහත්මිය, විධායක අධ්‍යක්ෂිකා, SLYCAN Trust ආයතනය |
| 1030 - 1100 | තේ විවේකය |
| 1100 - 1230 | තුන්වන සැසිය: දේශගුණික විපර්යාස වලට එරෙහි ක්‍රියාකාරකම් සඳහා ශක්‍යතා ගොඩනැගීම: අප දේශගුණික විපර්යාසයන්ට එරෙහිව පියවර ගත යුත්තේ ඇයි?<br>○ ජෙරාඩ් ටවුශර් මහතා - මෙහෙයුම් කළමනාකරු, ජාත්‍යාන්තර රතු කුරුස සංගමය සහ රතු අඩසඳ සංගමය<br>තේමාව: දේශගුණික විපර්යාස නිසා සිදුවන ආපදා වලදී සහන සැලසීම (විනාඩි 10)<br>○ ආචාර්ය ටර්නි ප්‍රදීප් කුමාර මහතා, සාමාන්‍යාධිකාරී, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය<br>තේමාව: දේශගුණික විපර්යාස, සමුද්‍රීය සහ වෙරළබඩ ප්‍රදේශවලට, ආර්ථිකයට සහ පරිසරයට බලපාන්නේ කෙසේද (විනාඩි 10)<br>○ ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>තේමාව: දේශගුණික විපර්යාස සහ වෙරළබඩ ප්‍රදේශ සහ ප්‍රජාවන් කෙරෙහි ඇති බලපෑම (විනාඩි 10)<br>○ සුමන්ත් බින්දුමාධව මහතා, වනජීවී වැඩසටහන් කළමනාකරු, Humane Society International ආයතනය, ඉන්දියාව<br>තේමාව: මානව-සත්ව ගැටුම්, දේශගුණික විපර්යාස (විනාඩි 10)<br>○ හේමන්ත ජයවීර මහතා - සම නිර්මාතෘ, Venture Frontier Sri Lanka, & Thuru<br>තේමාව: තරුණයින්ගේ හැකියාවන් වර්ධනය කිරීම, දේශගුණය සහ තිරසාර සංවර්ධනය සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා ඔවුන්ගේ තාක්ෂණික හැකියාව සවිබල ගැන්වීම (විනාඩි 10)<br>○ අචලා සමරදිවාකර මද්දුමගේ මිය, සම නිර්මාතෘ, Good Market |

| | |
|---|---|
| | තේමාව: සමාජ ව්‍යවසාය සංවර්ධනය සහ දේශගුණික සහ තිරසාර සංවර්ධන මූලාරම්භයන් (විනාඩි 10)<br><br>ප්‍රශ්නෝත්තර සැසිය |
| **1230 - 1315** | දිවා ආහාර විවේකය |
| **1315 - 1430** | Good Market ක්ෂේත්‍ර චාරිකාව |
| **1430 - 1530** | හතරවන සැසිය: තිරසාර සංවර්ධනය සහ දේශගුණික විපර්යාස පිළිබඳ අවධානය යොමු කරන ව්‍යාපෘති යෝජනා වැඩිදියුණු කිරීම සඳහා කණ්ඩායම් ක්‍රියාකාරකම්<br><br>ගෝලීය තරුණ සංසදයට අයදුම් කිරීමේදී සහභාගිවන්නන් විසින් තෝරාගනු ලබන තේමාවන් පදනම් කරගෙන මෙම යෝජනා සකස් කරනු ලැබේ.<br><br>යෝජනා සංවර්ධනය කිරීම සඳහා එක් එක් ක්ෂේත්‍රයන්හි විශේෂඥයින් තරුණ තරුණියන්ට සහාය වනු ඇත.<br><br>විශේෂඥ දායකත්වය:<br><br>○ ජයසිංහ නුගවෙලි මහතා, අධ්‍යක්ෂක, HSI, ඉන්දියාව (තිරසාර ජීවන රටා)<br><br>○ සුමන්ත් බින්දුමාධව මහතා, වනජීවී වැඩසටහන් කළමනාකරු, Humane Society International ආයතනය, ඉන්දියාව (වන-සත්ව ගැටුම්, ජෛව විවිධත්වය සහ දේශගුණික විපර්යාස)<br><br>○ සුරාජ් වන්නිආරච්චි මහතා, ව්‍යාපෘති සංවර්ධන, කාබන් උපදේශන සමාගම<br><br>○ ආචාර්ය ටර්නි ප්‍රදීප් කුමාර මහතා, සාමාන්‍යාධිකාරී, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය (වෙරළ හා සමුද්‍ර අංශය)<br><br>○ හේමන්ත ජයවීර මහතා, සම නිර්මාතෘ, Venture Frontier Sri Lanka, & Thuru<br><br>○ ජෙරාඩ් ටවුශර් මහතා, මෙහෙයුම් කළමනාකරු, ජාත්‍යන්තර රතු කුරුස සංගමය සහ රතු අඩසඳ සංගමය<br><br>○ මධු රත්නායක මිය, තිරසාර සම්බන්ධිකාරක, Good Market<br><br>○ ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| **1530 - 1545** | තේ විවේකය |
| **1545 - 1630** | ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම<br>ව්‍යාපෘති යෝජනා වැඩිදියුණු කිරීම සඳහා අනෙකුත් සහභාගීවන්නන්ගෙන් අදහස් විමසීම |
| **1630 - 1645** | ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශයේ ලේකම් අනුර දිසානායක මහතා විසින් සහතික පත් ප්‍රධානය කිරීම |
| **1645 - 1700** | ස්තුති කතාව |

# නීලහරිත ගම්මාන කතිකාව

| | |
|---|---|
| **Venue:** | සැෆ්රන් ශාලාව |
| **Date:** | 2018 ඔක්තෝම්බර් 19 |
| **Time:** | ප.ව 12.00 - ප.ව 6.00 |

පැරිස් ගිවිසුමේ පාර්ශවකාර රාජ්‍යයක් වශයෙන් ශ්‍රී ලංකාව එම ගිවිසුමේ වගකීම ඉටු කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද මූලික වැඩසටහනක් වන්නේ නීල හරිත ගම්මාන නියමු ව්‍යාපෘතියයි. එමගින් සමස්ථ දිවයිනම ආවරණය වන සේ තෝරාගත් ගම්මාන දස දහසක් (10, 000) දේශගුණ විපර්යාසයන්ගේ අහිතකර බලපෑම් වලට හොඳින් ඔරොත්තු දීමට හැකි වන සේ ප්‍රජාව සවිබල ගන්වා හරිත-සුහුරු ගම්මාන ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

ඒ සඳහා දැනට විවිධාකාරයෙන් දිවයින පුරා ගම්මාන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ආයතනය යටතේ ඇති ගම්මාන, නීල හරිත ගම්මාන වැඩසටහන තුළට අන්තර් ග්‍රහණය කිරීම ප්‍රමුඛ උපාය මාර්ගයක් ලෙසින් හඳුනාගෙන ඇත.

ඒ අනුව නීල හරිත ගම්මාන කතිකාව මඟින් එම සියළු ආයතන අතර පොදු කතිකාවතක් ඇරඹීමට වේදිකාවක් නිර්මාණය කිරීමට අපේක්ෂා කෙරේ.

**තේමාව:** “හරිත - සුහුරු පිළිවෙත එකමුතුකම බෙදාහදා ගැනීමයි”

**මාධ්‍යය:** සිංහල

**කතිකාවෙහි අරමුණ:** ගම්මාන සංවර්ධන වැඩසටහනේ නියැලී සිටින රාජ්‍ය, රාජ්‍ය නොවන හා ප්‍රජා මූලික සංවිධානයන්ට සාකච්ඡා සැසිවාරයේ දී එම ගම්මාන නීල හරිත ගම්මාන වැඩසටහනට අන්තර්ග්‍රහණය කල හැකි ආකාරය පිලිබඳ ඉදිරිපත් කිරීම් හා ප්‍රතිපෝෂණ ලබාගැනීමට සඳහා අවස්ථාව සලසා දීම.

නිදසුන් ලෙස සමෘද්ධි ආදර්ශ ගම්මාන වැඩසටහන, ගම් උදාව ජාතික වැඩසටහන, වැවක් සමග ගමක් වැඩසටහන, පාරිසරික හරිත ගම්මාන පලතුරු ගම්මාන වැඩසටහන, ඵලදායිතා ගම්මාන ආදිය දැක්විය හැක.

**අපේක්ෂිත සහභාගීවන්නන්:** ආරාධිත සහභාගීවන්නන් ගණන 60 දෙනෙකි. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ඵලදායිතා ලේකම් කාර්යාලය හා අනෙකුත් ගම්මාන සංවර්ධන වැඩසටහන් ආයතන වල සම්බන්ධීකරණ නිලධාරීන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් නීල හරිත ගම්මාන වැඩසටහන හා සම්බන්ධ වන නිලධාරීන් හා දැනට වැඩසටහන ක්‍රියාත්මකව පවත්නා නීල හරිත ගම්මානයන්හි තෝරා ගත් ගම්වැසියන් සහභාගී වීමට අපේක්ෂිතය.

**සංවිධානය:** පරිසර සැලසුම් හා ආර්ථික අංශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

| වේලාව | වැඩසටහන් විස්තරය |
|---|---|
| ප.ව. 12.00 | සහභාගිවන්නන් ලියාපදිංචි කිරීම |
| ප.ව. 12.15 | දිවා ආහාරය |
| ප.ව. 1.00 | පිළිගැනීමේ කතාව - ධම්මිකා විජයසිංහ මෙනෙවිය, අධ්‍යක්ෂ, පරිසර සැලසුම් හා ආර්ථික අංශය |
| ප.ව. 1.10 | ප්‍රධාන දේශනය - ගම්මාන සංවර්ධනයේ අත්දැකීම් - එදා සහ අද<br>ඩබ්ලිව්. එම්.ලීලසේන මහතා, අධ්‍යක්ෂ - ඒකාබද්ධ සංවර්ධන සංගමය |
| ප.ව. 1.30 | නීලහරිත ගම්මාන කතිකාවෙහි අරමුණ පැහැදිලි කිරීම<br>ලීල් රත්දෙනි, සහකාර අධ්‍යක්ෂ, පරිසර සැලසුම් හා ආර්ථික අංශය |
| ප.ව. 1.40 | තාක්ෂණික සැසිය 01: ආදර්ශ ගම්මාන සංවර්ධන වැඩසටහන් වල නියැලී සිටින පාර්ශවකාර ආයතන වල ඉදිරිපත් කිරීම් |
| ප.ව. 1.45 | සමෘද්ධි ආදර්ශ ගම්මාන වැඩසටහනෙන් උගත් පාඩම් හා Success stories: ඒ.ජී වෙල්ලප්පිලි මහතා, (අධ්‍යක්ෂ-ආර්ථික සවිබල ගැන්වීම් හා ග්‍රාම සංවර්ධන), සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව |
| ප.ව. 2.00 | ගම් උදාව වැඩසටහන නීලහරිත ගම්මාන වැඩසටහන සමඟ අනුකලනය කිරීම, හේමමාලි වික්‍රමරත්න මිය, ජ්‍යෙෂ්ඨ වාස්තු විද්‍යාඥ,ජාතික නිවාස සංවර්ධන අධිකාරිය |
| ප.ව. 2.15 | පලතුරු ගම්මාන වැඩසටහන නීලහරිත ගම්මාන වැඩසටහන සමඟ ඒකාබද්ධ කිරීම - මල්කාන්ති මහගණආරච්චිගේ, සහකාර අධ්‍යක්ෂ, පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| ප.ව. 2.30 | නීලහරිත ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය - ආචාර්ය ඩබ්ලිව්. ජේ. එම්. දයාරත්න මහතා, සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ) ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව |
| ප.ව. 3.00 | ධීවර ප්‍රජාවේ දේශගුණ විපර්යාස පාත්‍රීභාවය හා “වැවක් සමඟ ගමක්” හා “කලපුවක් සමඟ ගමක්” වැඩසටහන්වල මැදිහත් වීම - චතුරිකා කොඩිතුවක්කු මිය, සහකාර අධ්‍යක්ෂ - කිවුල්දිය ධීවර කළමනාකරණ ඒකකය, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව |
| ප.ව. 3.15 | සමූහ සාකච්ඡාව - ප්‍රශ්න, ගැටළු, අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම හා කතිකාව |
| ප.ව. 3.30 | සවස තේ පානය |
| ප.ව. 3.45 | තාක්ෂණික සැසිය - 02: හරිත සංවර්ධන මූලාරම්භයන් හා වෙනත් විවිධ වැඩසටහන් නීල හරිත ගම්මාන වැඩසටහන සමඟ අනුකලනය කිරීම් |
| ප.ව. 4.00 | ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ඔසු ගොවිපළ වැඩසටහන හා පෝෂණ ගම්මාන වැඩසටහන නීලහරිත ගම්මාන වැඩසටහන සමඟ ගැලපීම, සුදීපා සුගතදාස මහත්මිය, විද්‍යාඥ (වනස්පති), ආයුර්වේද දෙපාර්තමේන්තුව |
| ප.ව. 4.15 | හරිත ඵලදායීතාවය: උගත් පාඩම් නීලහරිත ගම්මාන වැඩසටහනට අනුකලනය කිරීම - සුදත් අබේසිරිවර්ධන මහතා, ඵලදායීතා ප්‍රවර්ධන නිලධාරී, ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලය |

| | |
|---|---|
| **ප.ව. 4.30** | දේශීය කුළුබඩු බෝග නිෂ්පාදන කාබනික සහතිකකරණය කිරීමේ වැඩසටහන නීලහරිත ගම්මාන වැඩසටහන සමඟ ඒකාබද්ධ කිරීම - උපාලි කොඩිකාර මහතා, අංශ ප්‍රධානී, ව්‍යාපාර උපදේශන ඒකකය, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| **ප.ව. 4.45** | හරිත ගම්මාන වැඩසටහනෙහි අත්දැකීම් බෙදාහදා ගැනීම හා අනුකලනය කිරීම - ඒකාබද්ධ සංවර්ධන සංගමය, කුණ්ඩසාලේ - දුමිඳු හේරත් මහතා, සම්බන්ධීකාරක - ඒකාබද්ධ සංවර්ධන සංගමය, කුණ්ඩසාලේ |
| **ප.ව. 5.00** | සමූහ සාකච්ඡාව - ප්‍රශ්න, ගැටළු, අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම හා කතිකාව |
| **ප.ව. 5.30** | නීලහරිත ගම්මාන සංගායනාවේ 2019 වසරේ ශ්‍රී ලංකා නෙක්ස්ට් දක්වා ඉදිරි වැඩ සටහන ඉදිරිපත් කිරීම - ලීල් රත්දෙනි මහතා, සහකාර අධ්‍යක්ෂ, පරිසර සැලසුම් හා ආර්ථික අංශය |
| **ප.ව. 5.50** | ස්තුති කථාව - අනුරුද්ධ තෙන්නකෝන් මහතා, සහකාර අධ්‍යක්ෂ, පරිසර සැලසුම් හා ආර්ථික අංශය |
| **ප.ව. 6.00** | වැඩසටහන නිමාව |

## Forest Research Symposium

| | |
|---|---|
| **Venue:** | ලැවෙන්ඩර් ශාලාව |
| **Date:** | 2018 ඔක්තෝබර් 20 |
| **Time:** | පෙ.ව 8.30 - ප.ව 4.30 |

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වන පර්යේෂණ සම්මන්ත්‍රණය වනාන්තර ආශ්‍රිත පර්යේෂණ කටයුතුවල නිරත වන විවිධ පර්යේෂකයින්හට සිය සොයාගැනීම්, වනාන්තර කළමනාකරුවන් සමඟ බෙදා හදා ගනිමින් සංසදයකදී ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙයි. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, විශ්වවිද්‍යාල, රාජ්‍ය නොවන සංවිධාන, පර්යේෂණ සංවිධාන යනා දී විවිධ ආයතන වනාන්තර ආශ්‍රිත පර්යේෂණ කටයුතු වල නිරතව සිටිති. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වනාන්තර හා සම්බන්ධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන රටේ ප්‍රධානතම ආයතනය බැවින් මෙම පර්යේෂණ තුළින් සිදු කරන නව සොයා ගැනීම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉතාම වැදගත් වේ.

වර්තමානයේ දී වෙනත් ආයතන විසින් ද වනවිද්‍යාවට සහ පරිසරයට සම්බන්ධ පර්යේෂණ සම්මන්ත්‍රණ සංවිධානය කරන අතර මෙමඟින් වන ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය උදෙසා ඉතාම වටිනා තොරතුරු සැපයේ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ජාතික වන පර්යේෂණ කමිටුව විසින් පර්යේෂකයින්හට වනාන්තර තුළ පර්යේෂණ කටයුතු සිදුකිරීම සඳහා අවසර ලබාදෙන අතර මෙම පර්යේෂණ තුළින් සොයාගනු ලබන නවතම තොරතුරු වනාන්තර කළමනාකරණය සඳහා යොදාගැනීම උදෙසා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ හුවමාරු කරගැනීම අවශ්‍යවේ. ඒ අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික වන පර්යේෂණ සම්මන්ත්‍රණයේදී සිය නවතම සොයාගැනීම් ඉදිරිපත් කිරීමට පර්යේෂකයින්ව දිරිමත්කරනු ලැබේ.

මෙම පර්යේෂණ සම්මන්ත්‍රණයේ දී ප්‍රධාන වශයෙන් සිංහරාජ, කන්නෙලිය සහ අනෙකුත් තෙත් කලාපීය වනාන්තර ආශ්‍රිතව සිදු කරන ලද පර්යේෂණ කටයුතු පිළිබඳව මෙන්ම වනාන්තර ප්‍රතිස්ථාපනය පිළිබඳවද සාකච්ඡා කෙරේ. මෙයට පෙර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිංහරාජ වනාන්තර සංකීර්ණය සඳහා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීමේ දී වැඩමුළුවක් සංවිධානය කළ අතර මෙම සම්මන්ත්‍රණය එම කටයුතු ඉදිරියට කරගෙනයාම සඳහා අත්වැලකි. අතීතයේදී විවිධ පර්යේෂකයින් විසින් සිංහරාජ වනාන්තරය හා සම්බන්ධව පර්යේෂණ රාශියක් සිදු කර තිබෙන බැවින් ඉන් ලද නව සොයා ගැනීම් සංසදයකදී ඉදිරිපත් කිරීම සහ එම නව සොයා ගැනීම් වන කළමනාකරුවන් විසින් ප්‍රයෝජනයට ගැනීම කාලෝචිත ක්‍රියාවකි. සිංහරාජ වනාන්තරය තුල විශ්ව විද්‍යාල විසින් සිදුකළ ඇතැම් දීර්ඝ කාලීන පර්යේෂණ විශේෂයෙන්ම, දේශගුණික විපර්යාසයන්ට ප්‍රතිචාර ලෙස මෙම පරිසර පද්ධති දීර්ඝ කාලීනව හැසිරෙන ආකාරය අධ්‍යයනය කිරීම සඳහා බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.

මෙම සම්මන්ත්‍රණය මඟින් පසුගිය කාලයේදී සිදු කරන ලද ආක්‍රමණික ශාක විශේෂ කළමනාකරණය, ශාක ව්‍යාප්තියේ සුලබතාවය, ශාක විවිධත්වය, අක්මා ශාක, ලයිකන, කාබන් තිරකිරීම, ඇතැම් සත්ත්ව විශේෂ පිළිබඳ අධ්‍යයනයන් ආදී අංශ ආවරණය කරනු ලැබේ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වනාන්තර ප්‍රතිස්ථාපනය කිරීමේ කටයුතුවල සක්‍රියව නියැලී සිටින අතර පර්යේෂණ කටයුතුවලින් ලැබෙන නවතම සොයාගැනීම් හායනයට පත්වූ වනාන්තර විවිධ ප්‍රතිස්ථාපන කටයුතු තුළින් වැඩි දියුණු කිරීම සඳහා ප්‍රයෝජනවත්වනු ඇත. එවැනි හායනයට පත්වූ වනාන්තර වල වගා කිරීමට සුදුසු දේශීය ශාක විශේෂ හඳුනා ගැනීම, සහාය ලද ස්වාභාවික පුනර්ජනන කටයුතු, ආක්‍රමණශීලී ශාක විශේෂ පාලනය කිරීම සහ අනෙකුත් ඒ හා සම්බන්ධ අධ්‍යයනයන්ට අදාළ පර්යේෂණ වල නිරත වීම අත්‍යාවශ්‍ය කරුණක් වන අතර ඒවා වන පාලකයින්හට සිය නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වැදගත් වේ. තෙත් කලාපීය වනාන්තර කෙරෙහි අවධානය යොමුකරන මෙම

සම්මන්ත්‍රණය මෙම වනාන්තරවල කළමනාකරණ කටයුතු ප්‍රවර්ධනය සඳහා විශාල වශයෙන් දායකවනු ඇත.

**සන්නිවේදන මාධ්‍යය:** ඉංග්‍රීසි

**අපේක්ෂිත සහභාගීවන කණ්ඩායම:** වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, විශ්ව විද්‍යාලවල සහ පර්යේෂණ ආයතනවල, පුද්ගලික අංශයේ සහ රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයින්

**සංවිධානය:** වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**සහභාගී වන සංඛ්‍යාව:** 120

**සම්බන්ධීකරණය:**

- ආචාර්ය. එන්. ඩී. ආර්. වීරවර්ධන, අතිරේක වන සංරක්ෂණ ජනරාල් (පර්යේෂණ සහ අධ්‍යාපන), වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, සම්පත්පාය, බත්තරමුල්ල.
  (+ 94 (0) 11 286 6635, adcgf.re@gmail.com)

**න්‍යාය පත්‍රය: තෙත් කලාපීය වනාන්තර පිළිබඳ වන පර්යේෂණ සම්මන්ත්‍රණය**

| වේලාව | වැඩසටහන් විස්තරය |
|---|---|
| **8.30 - 9.00** | ලියාපදිංචිය |
| **පළමුවන සැසිය** | |
| **9.00 - 9.05** | පිළිගැනීමේ කතාව: ආචාර්ය. එන්.ඩී.ආර්.වීරවර්ධන, අතිරේක වන සංරක්ෂක ජනරාල් |
| **9.05 - 9.10** | සමාරම්භක දේශනය - අනුර සතුරුසිංහ මහතා, වන සංරක්ෂණ ජනරාල් |
| **9.10 - 9.30** | ප්‍රධාන දේශනය - ගෝලීය සහ ප්‍රාදේශීය අවශ්‍යතා සපුරාලමින් ශ්‍රී ලංකාවේ නිවර්තන තෙත් කලාපීය වනාන්තර තිරසාර ලෙස කළමනාකරණය කිරීම: මූලික වෙනස්වීමක අවශ්‍යතාවය ?<br>මහාචාර්ය. අනෝමා පෙරේරා, අංශාධිපති, උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| **9.30 - 9.45** | කන්නෙලිය පහතරට වර්ෂා වනාන්තරය තුල ආක්‍රමණික ශාකවල අවකාශීය ව්‍යාප්තිය සහ විවිධත්වය - එල්.පී.එම්.හසන්ති |
| **9.45 - 10.00** | කන්නෙලිය-දෙදියගල-නාකියාදෙනිය වන සංකීර්ණයේ ශාක විශේෂ සංරක්ෂණයෙහිලා වැදගත්වන ශාක ව්‍යාප්තිය පිළිබඳ සමාලෝචනයක් - එම්.ඩී.කේ.එල්.ගුණතිලක |
| **10.00 - 10.10** | සාකච්ඡාව |
| **10.10 - 10.40** | තේ පැන් සංග්‍රහය |
| **දෙවන සැසිය** | |

| | |
|---|---|
| **10.40 - 10.55** | ශ්‍රී ලංකාවේ ලෝක උරුම සිංහරාජ වනාන්තරයේ දීර්ඝ කාලීන පර්යේෂණ - නිමල් ගුණතිලක |
| **10.55 - 11.10** | ශ්‍රී ලංකාවේ පහතරට වර්ෂා වනාන්තරයක විශේෂ සංයුතියේ සහ පාදස්ථ වර්ෂඵලයේ දීර්ඝ කාලීන වෙනස්කම් - චම්පිකා බණ්ඩාර |
| **11.10 - 11.25** | ශ්‍රී ලංකාවේ *Memecylon* (Melastomataceae) ශාක විශේෂයේ වංශ ප්‍රවේණිය සහ නිකේතන පරිණාමය පිළිබඳ අවබෝධය - එච්.එස්.කත්‍රිආරච්චි |
| **11.25 - 11.40** | කන්නෙලිය වනාන්තරයේ ශාක විවිධත්වය - එච්.ටී.ඒ.ආර්.කරුණානන්ද |
| **11.40 - 11.55** | *Ampelocissus indica* (L.) ශාකය පිළිබඳ මූලික සමීක්ෂණය; ආසියාතික රටවල්වල හමුවන වන මිදි විශේෂය අගය එකතුකළ නිශ්පාදනයක් ලෙස - ඩබ්ලිව්.එල්. ප්‍රනාන්දු |
| **11.55 - 12.10** | සිංහරාජ සහ කන්නෙලිය වනාන්තරවල හමුවන පත්‍රාකාර අක්මා ශාක - බී.එම්.එස්.කේ.බන්ඩාරණායක |
| **12.10 -12.25** | ශ්‍රී ලංකාවේ නිවර්තන වනාන්තර තුල හමුවන ලයිකන: නව විශේෂ හඳුනාගැනීම තුලින් - සිරිල් විජේසුන්දර |
| **12.25 - 12.35** | සාකච්ඡාව |
| **12.35 - 13.35** | දිවා භෝජනය |
| **තෙවන සැසිය** | |
| **13.35 - 13.50** | ශ්‍රී ලංකාව ලයිකන සඳහා තෝතැන්නක් ලෙස: විවිධත්වයෙන් අනූන ස්ථානවල ලයිකනවල සුලබතාව අවබෝධ කර ගැනීම - සිරිල් විජේසුන්දර |
| **13.50 - 14.20** | ශ්‍රී ලංකාවේ උච්චත්ව අනුක්‍රමණයක් ඔස්සේ තෙත් කලාපීය වනාන්තරවල කාබන් තිරකිරීම, ශාක ක්‍රියාකාරකම් සහ ජෛව විවිධත්වය කෙරෙහි පාරිසරික වෙනස්වීම්වලින් සිදුවියහැකි බලපෑම ඇස්තමේන්තුගත කිරීම - ඩබ්ලිව්. ඒ.ජේ.එම්. ද කොස්තා |
| **14.20 - 14.35** | ශ්‍රී ලංකාවේ සිංහරාජ ලෝක උරුම භූමියට අයත් පරිවාර වනාන්තර තුල ආක්‍රමණික ශාක විශේෂවල පැවැත්ම සහ ඒවායේ කළමනාකරණ විකල්පයන් පිළිබඳ වර්තමාන තත්වය - එස්.එච්. බන්ධුමාලා |
| **14.35 - 14.50** | කෘත්‍රිම තත්වයන් යටතේ *Exacum ritigalensis* ශාකය මුල් ඇද්දවීම කෙරෙහි සක්‍රිය කාබන්වල බලපෑම - පී.සී.ඩී.පෙරේරා |
| **14.50 - 15.05** | ස්වභාව අධ්‍යයනය, පර්යේෂණ පුහුණු කටයුතු සහ සංසන්දනය සඳහා උචිත ස්ථානයක් ලෙස සිංහරාජ ලෝක උරුම භූමිය - සරත් ඩබ්ලිව්. කොටගම |
| **15.05 - 15. 15** | සාකච්ඡාව |

| සිව්වන සැසිය | |
|---|---|
| 15.15 - 15.30 | ජාතික ප්‍රමුඛතාවක් ලෙස පහතරට වර්ෂා වනාන්තරවල ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම: ශ්‍රී ලංකාවට ආවේණික ක්ෂීරපායීන් වඳවීයාමේ තර්ජනයෙන් ආරක්ෂාකිරීම සඳහා - වොල්ෆ්ගෑංග් ඩිට්ටස් |
| 15.30 - 15.45 | සිංහරාජ ලෝක උරුම භූමියේ විවිධ වර්ගයේ ආහාර ගන්නා පක්ෂීන් රෑන් සමඟ වසර තිහක් - තවමත් නොවිසඳුණු අබිරහස් රැසක් සමඟින් - සරත් ඩබ්ලිව්. කොටගම |
| 15.45 - 16.00 | පියාසරකරන සත්වයින් සඳහා සිංහරාජ සහ කන්නෙලිය මිනිසා සහ ජෛවගෝල රක්ෂිතවල පරිණාමික වැදගත්කම - සම්පත් සෙනෙවිරත්න |
| 16.00 - 16.15 | ශ්‍රී ලංකාවේ දෙල්වලකන්ද සහ වලංකන්ද පහතරට වර්ෂා වනාන්තර සම්බන්ධ කරන්නාවූ යෝජිත එන්දන ජෛව විවිධත්ව මංකඩේ ශාක සහ පස පිළිබඳ පාද රේඛා සමාලෝචනය - නාලක ගීකියනගේ |
| 16.15 - 16. 30 | සාකච්ඡාව |
| 16.30 | තේ පැන් සංග්‍රහය |

| | |
|---|---|
| **Venue:** | සිනමා ශාලාව |
| **Date:** | 2018 ඔක්තෝබර් 19 |
| **Time:** | ප.ව 1.30 - ප.ව 6.30 |

දේශගුණික විපර්යාස පිළිබඳ ලේකම් කාර්යාලය, NCC ශ්‍රී ලංකා ආයතනය හා ජනතාක්ෂන් ආයතනය එක්ව සංවිධානය කරනු ලබන මෙම වැඩසටහන් ප.ව 1.30 සිට ප.ව 6.30 දක්වා පැවැත්වේ. විද්වත් මඩුල්ලක් මගින් පවත්වන සාකච්ඡා වට දෙකක් ලෙස පවත්වන මෙම වැඩසටහනෙහි අරමුණ වන්නේ දේශගුණික විපර්යාස අවම කිරීමට හා එයට මුහුණදීම සඳහා පෞද්ගලික අංශයේ කාර්ය භාරය හඳුනා ගැනීම සහ ඒ සඳහා වැඩපිළිවෙලක් යෝජනා කිරීමයි.

**වැඩසටහනේ මූලික අරමුණ:** ව්‍යාපාරික ප්‍රජාව දේශගුණික විපර්යාස වලට මුහුණදීම සඳහා ඒකාබද්ධ සැලැස්මක් ආරම්භ කිරීම

**සහභාගිවන කණ්ඩායම:** පෞද්ගලික නියෝජිතයින් 100, රාජ්‍ය, විශ්වවිද්‍යාලයීය, පර්යේෂණ අංශයෙන් 50.

| වේලාව | වැඩසටහන් විස්තරය |
|---|---|
| 13.30 - 13.45 | සමාරම්භක දේශනය -ගරු ලේකම් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය |
| 13.45 - 15.30 | දේශගුණික විපර්යාස සම්බන්ධ ජාතික ප්‍රමුඛතා - පෞද්ගලික අංශයේ කාර්ය භාරය: ජාතිකව නිර්ණය කරන ලද දායකත්ව සහ ඉදිරි ගමන්මග, මධ්‍ය කඳුකර ජල පෝෂක රැක ගැනීම, පෞද්ගලික අංශයේ වගකීම, ජාතිකව නිර්ණය කරන ලද දායකත්වයන් ඉටු කිරීමේදී පෞද්ගලික අංශය මුහුණ දෙන ගැටළු |
| 15.30 - 16.00 | තේ විවේකය |
| 16.00 - 18.30 | දේශගුණික වෙනස්වීම් තත්ත්වයන් තුළදී යෝග්‍ය ආයෝජන අවස්ථා හා අභියෝග:<br>දේශගුණික වෙනස්වීම් නිසා වැඩිවී ඇති ව්‍යාපාරික අවදානම, අන්තර්ජාතික මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා පුද්ගලික අංශයට ඇති අවස්ථා, දේශගුණික වෙනස්වීම්වලට මුහුණ දීමේදී ඇති දැනුම හා කුසලතා අඩුපාඩු |

## දේශගුණ විපර්යාස පර්යේෂණ සමුළුව

| | |
|---|---|
| **Venue:** | සිනමා ශාලාව |
| **Date:** | 2018 ඔක්තෝබර් 19 |
| **Time:** | පෙ.ව 8.00 - ප.ව 5.00 |

ශ්‍රී ලංකාව දේශගුණ විපර්යාසයන්ගේ අහිතකර බලපෑම් වලට දැඩිව ලක්වේ. දේශගුණ විපර්යාස පිලිබඳ රාමුගත සම්මුතියේ (UNFCCC) පාර්ශවකර රටක් ලෙස ශ්‍රී ලංකාව දේශගුණ විපර්යාසයන්ගේ අභියෝගයන්ට මුහුණ දීමට සහ ඊට එරෙහිව ක්‍රියාත්මක වීමේ සිය ගෝලීය කාර්යභාරය අවබෝධ කරගෙන ඇති අතර එම සම්මුතියේ 21වන පාර්ශවකරුවන්ගේ රැස්වීමේදී එකඟත්වය ලබාදුන් පැරිස් ගිවිසුමට අපරනුමතිය ලබාදී ඇත. ශ්‍රී ලංකාව සිය ජාතික වශයෙන් තීරණය කරනලද දායකත්ව ඉදිරිපත්කර ඒවා ක්‍රියාත්මක කිරීමට සුදනම්වීමේ සැලසුමක් සකස්කර ඇත. ශ්‍රී ලංකාව පැරිස් ගිවිසුමේ 2030 න්‍යාය පත්‍රය සහ තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමට දක්වන කැපවීම පිළිබිඹු කිරීමට "ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්*" වැඩසටහන දියත්කර ඇත.

දැඩි අවදානමට ලක්වී ඇති ප්‍රජාවන්, ක්ෂේත්‍ර සහ ප්‍රදේශ වල ඔරොත්තුදීමේ හැකියාව වර්ධනය සඳහා සුදුසු අනුහුරු ක්‍රියාමාර්ග ගැනීමට දේශගුණ විපර්යාසයන්ගේ බලපෑම් හේතුවන් ඇතිවන අවදානම් ඇගයීමට මෙන්ම හරිතගාර වායු විමෝචනය අවම කිරීමට අදාල ක්ෂේත්‍ර සහ ක්‍රියාකාරකම් හඳුනා ගැනීමට දේශගුණ විපර්යාස පිලිබඳ සවිස්තරාත්මක සහ පරිපූර්ණ පර්යේෂණ උපායමාර්ගයක් පැවතීම ඉතා වැදගත් වේ. මෙමගින් ලබාගැනීමට අපේක්ෂිත ප්‍රතිලාභ අතර;

- ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාසවලට ඔරොත්තුදීම ඉහල නැංවීමේ ක්‍රියාවලියට සහය දැක්වීම
- ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සුදුසු හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ ක්‍රියාවන්ට සහය වීම
- ගෝලීය බැඳීම්වලට අනුව දේශගුණ විපර්යාස පිලිබඳ වාර්තාකරණයන් සඳහා රටේ ධාරිතාවය ඉහළ නැංවීම
- දේශගුණ විපර්යාස ආශ්‍රිත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී සුදුසු ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රනය හඳුනාගැනීම සඳහා රටේ ධාරිතාවය ඉහල නැංවීම

වඩා සාර්ථක අනුහුරු සහ අවම කිරීමේ ක්‍රියාකාරකම් කෙරෙහි යොමුවීමට සහ පවතින අඩුපාඩු හඳුනා ගැනීමට දැනට සිදුකර ඇති අධ්‍යන සහ ඇගයීම් සමාලෝචනය උපකාරී වේ. දේශගුණ විපර්යාසයන් හා බැඳුනු සියලු මානයන්ගේ වඩා දැනුවත් තීරණ ගැනීම සඳහා මෙම දේශගුණ විපර්යාස පර්යේෂණ උපායමාර්ගය මගින් පහසුකම් සපයයි. ඉදිරි වසර 5 (2019-2023) සඳහා දේශගුණ විපර්යාස පර්යේෂණ උපායමාර්ගය සැකසීමට තෙවන ජාතික සන්නිවේදන වාර්තාව සැකසීමේ එක් අංගයක් ලෙස මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශයේ දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය කටයුතු යොදා ඇත.

මෙම දේශගුණ විපර්යාස පර්යේෂණ උපායමාර්ගය සැකසීමේ ක්‍රියාවලිය සඳහා අදාල පාර්ශවකර ආයතනවල සක්‍රිය සහභාගිත්වය ලබාගැනීමේ අරමුණින් "ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්*" 2018 වැඩසටහනට සමගාමීව දේශගුණ විපර්යාස පර්යේෂණ සමුළුව සංවිධානය කර ඇත.

- දේශගුණ විපර්යාස පර්යේෂණ උපායමාර්ගය කෙටුම්පත සඳහා අදහස් ලබා ගැනීම
- දේශගුණ විපර්යාස පර්යේෂණවල පවතින හිඩැස් හඳුනා ගැනීම
- දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලයේ දේශගුණ විපර්යාස පර්යේෂණ පිලිබඳ තොරතුරු ගබඩාව එළිදැක්වීම
- දේශගුණ විපර්යාස හා ආශ්‍රිත ගැටළු සම්බන්ධයෙන් ශ්‍රී ලාංකික පර්යේෂකයින්ගේ දැනුවත් භාවය ඉහල නැංවීම

**පැවැත්වෙන මාධ්‍ය:** සිංහල හා ඉංග්‍රීසි

**සහභාගිත්වය:** රජය ආයතන, විශ්ව විද්‍යාල ප්‍රජාව, සිවිල් සංවිධාන

**සංවිධානය:** මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය, තෙවන ජාතික සන්නිවේදන වාර්තාව සැකසීමේ ව්‍යාපෘතියේ පාර්ශවකරුවන් වන (ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය, ජනතාක්ෂන්, ස්යිකන් ට්‍රස්ට්, අයිඩියා)

මෙම සමුළුවේ ප්‍රතිඵල #CCForumSL2018 හරහා සමාජ මාධ්‍ය අතර හුවමාරු කරගැනීමට බලාපොරොත්තු වේ.

**න්‍යාය පත්‍රය: දේශගුණ විපර්යාස පර්යේෂණ සමුළුව**

| වේලාව | වැඩසටහන් විස්තරය |
|---|---|
| **පළමු සැසිය** | ජාතික දේශගුණ විපර්යාස පර්යේෂණ උපායමාර්ගය හඳුන්වාදීම |
| **පෙ.ව 9.00 - පෙ.ව 11.00** | මෙහිදී ජාතික දේශගුණ විපර්යාස පර්යේෂණ උපායමාර්ගය හඳුන්වාදීම (අවශ්‍යතාවය, අඩංගු කරුණු, ක්‍රමවේදය වැඩිදියුණු කිරීම වැනි) හා ඒ සඳහා අදහස් ලබාගැනීමට බලාපොරොත්තු වේ. සැසිය අවසානයේදී දේශගුණ විපර්යාස පර්යේෂණ පිලිබඳ තොරතුරු ගබඩාව එළිදැක්වීම සිදුවේ |
| **දෙවන සැසිය** | ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස පර්යේෂණ ඉදිරිපත් කිරීම |
| **පෙ.ව 11.30 - ප.ව 1.30** | මෙම සැසියේදී දැනට අවසන් කර ඇති පර්යේෂණ කිහිපයක් හා ඉන් හඳුනාගත් දේශගුණ විපර්යාස ගැටළු ඉදිරිපත් කරන අතර දේශගුණ විපර්යාස පර්යේෂණ සිදුකිරීමේදී පවතින අභියෝග සහ උගත් පාඩම් සාකච්චාවට ගැනේ. |
| **තෙවන සැසිය** | දේශගුණ විපර්යාස පර්යේෂණ හිදැස් හඳුනා ගැනීම |
| **ප.ව 2.30 - ප.ව 4.30** | මෙම සැසියේදී අන්තර්ජාතික හා ජාතික බැඳීම්වලට අනුව පවතින පර්යේෂණ හිදැස් හඳුනාගැනීම පිලිබඳ සාකච්චා කෙරේ. |

## කඩොලාන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව

| | |
|---|---|
| **Venue:** | මිහිලක මැදුර |
| **Date:** | 2018 ඔක්තෝබර් 19 |
| **Time:** | පෙ.ව 11.00 - ප.ව 3.00 |

**වැඩසටහන : කඩොලාන පරිසර පද්ධතිය සංරක්ෂණය හා තිරසර භාවිතය පිළිබඳ පාසැල් සිසුන් දැනුවත් කිරීමේ ප්‍රායෝගික වැඩමුළුව**

මධ්‍යම ප්‍රමාණයේ දිවයිනක් වන අප රටේ ඉතා කුඩා ප්‍රදේශයක් තුළ එකිනෙකට වෙනස්වූ පරිසර පද්ධති විශාල ප්‍රමාණයක් හඳුනාගත හැක. ඒ අතරින් අතිශය වැදගත්කමක් සහිත අඩුම ව්‍යාප්තියක් පෙන්වන්නාවූ සුවිශේෂී පරිසර පද්ධතියක් මෙන්ම හා දැඩිලෙස තර්ජනයට ලක්වූ පරිසර පද්ධතියක් ලෙස කඩොලාන පරිසර පද්ධතිය හඳුනාගෙන ඇත.

මේ වන විට හෙක්ටෙයාර 12,000 ත් 15,668 ත් අතර වූ භූමි ප්‍රමාණයක කඩොලාන ව්‍යාප්ත වී ඇතැයි ගණන් බලා ඇතිමුත් නිශ්චිත ආවරණය කොපමණදැයි හඳුනාගෙන නොමැත. ශ්‍රී ලංකාව තුළ සැබෑ කඩොලාන විශේෂ 22 ක් හා කඩොලාන ආශ්‍රිත වෘක්ෂලතා විශේෂ කිහිපයක් හඳුනා ගෙන තිබේ. මෙහිදී වඩාත් වැදගත් වන්නේ ලෝක කඩොලාන භූමි ප්‍රමාණයෙන් 0.001 % ක් ආවරණය වීම හා ලොව පවතින කඩොලාන ජීවී විශේෂ වලින් තුනෙන් එකක් මෙමගින් නියෝජනය කිරීමයි.

වෙරළබඩ කලාපයේ සමතුලිතතාවය පවත්වා ගෙන යාමෙහිලා කඩොලාන අතිශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඒ අතරින් ආහාර සම්පාදනය, වෙරළබඩ හා අභ්‍යන්තර පරිසර පද්ධති අතර පිහිටමින් දෙදිශාවටම පෙරහන් වශයෙන් ක්‍රියා කිරීම සිදු කරයි. වනාන්තර අතර නිවර්තන කළාපයෙහි වඩාත් කාබන් අවශෝෂක වනාන්තරයක් ලෙස කඩොලාන සලකන අතර දේශගුණ විපර්යාසවල හානිය අවම කරන කාබන් අවශෝෂකයක් වශයෙන් වැදගත් කාර්යය භාරයක් ඉටු කරයි. ජීව විද්‍යාත්මකව ගත් කල කඩොලාන පරිසර පද්ධතිය ස්ථිරව වාසය කරන හෝ සිය ජීවන චක්‍රයේ යම් අවස්ථාවක කොටසක් වශයෙන් තාවකාලිකව සංක්‍රමණය වන හෝ ජීවී විශේෂ සඳහා ආහාර හා අභිජනන වාසභූමි සපයයි.

කෙසේ වුවද, වර්තමානයේදී මෙම සුවිශේෂී පරිසර පද්ධතිය විවිධ මානව ක්‍රියාකාරකම් නිසා වඩාත් තර්ජනයට ලක් වෙමින් පවතී. ඒ අතරින් අවධිමත් ලෙස ගස් කැපීම, භූමි ගොඩකිරීම, කැලි කසල බැහැර කිරීම, ජලජීවී වගා පද්ධතිවලට සහ ලුනු ලේවායන් සඳහා විනාශ කිරීම සහ වෙනත් වෙරළබඩ සංවර්ධන ක්‍රියාකාරකම් හඳුන්වා දිය හැකිය.

ඒ අනුව ජෛව විවිධත්ව සම්මුතියේ කේන්ද්‍රීය මධ්‍යස්ථානය වශයෙන් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් මෙම සුවිශේෂී වූ පරිසර පද්ධතිය සංරක්ෂණය හා තිරසර භාවිතය සම්බන්ධයෙන් අදාල රාජ්‍ය, පෞද්ගලික හා රාජ්‍ය නොවන ආයතන නිළධාරීන්, පාසැල් සිසුන් සහ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

කඩොලාන පරිසර පද්ධතිය සංරක්ෂණය ප්‍රමුඛ අවශ්‍යතාවක් ලෙස ගෝලීය වශයෙන් පෙන්වා දී ඇති අතර පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍යයන් අතර කඩොලාන සංරක්ෂණය සඳහා මූලිකයා ලෙසද ශ්‍රී ලංකාව ක්‍රියා කරයි. එබැවින් ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය විසින් මෙවර ශ්‍රී ලංකා නෙක්ස්ට් නීල හරිත යුගයක් වැඩසටහන සඳහා කඩොලාන පරිසර පද්ධතියේ වැදගත්කම, කඩොලාන විශේෂ හඳුනා ගැනීම, ව්‍යාප්තිය, තර්ජනයට ලක්වීමට හේතු හා සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් පාසැල් සිසුන් දැනුවත් කිරීම සඳහා ප්‍රායෝගික වැඩමුළුවක් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

මෙම වැඩමුළුව කඩොලාන පරිසර පද්ධතිය රැකගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරන පම්බල සුළු ධීවර සම්මේලනය [Small Fishers Federation of Sri Lanka (SUDEESA)] හා එක්ව

සංවිධානය කරනු ලබන අතර සම්පත් දායකත්වය කඩොලාන සංරක්ෂණය හා තිරසර භාවිතය සම්බන්ධ ජාතික විද්වත් කමිටුව හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ලබාදෙයි.

**අරමුණ:** අනාගත පරම්පරාවේ දැනුම සහ ඔවුන් පරිසර පද්ධති රැකගැනීම සඳහා දක්වන ආකල්පය මත කඩොලානවල අනාගතය රඳා පවතී. කඩොලාන පැවැත්මේ වටිනාකම පිළිබඳ අනාගත පරම්පාව දැනුම්වත් කිරීම සහ කඩොලාන පරිසර පද්ධතිය රැකගන්නා පරපුරක් ඇතිකිරීම මෙම වැඩසටහනෙහි ප්‍රධානම අරමුණයි.

**ඉලක්ක ගත කණ්ඩායම:** මෙම දැනුවත් කිරීමේ වැඩමුළුවෙන් ලබාගන්නා දැනුමෙන් කඩොලාන සංරක්ෂණය පිළිබඳව පරිසර නියමු ව්‍යාපෘති සකසා වැඩිහිටියන්ද සහභාගී කරවා ගනිමින් ඔවුන්ගේ මට්ටමෙන් මෙම පරිසර පද්ධතිය රැක ගැනීමේ ක්‍රියාකාරකම් සිදුකිරීමට උනන්දුව ඇතිකිරීමේ බලාපොරොත්තුවෙන් පරිසර නියමුවන් මෙම වැඩමුළුවට සහභාගී කරවා ගැනීමට තීරණය කරන ලදී. තවද  පැමිණෙන සිසුන් හා ගුරුවරුන් හට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා SUDEESA හා එක්ව මෙවැනි ක්‍රියාකාරකම් ඔවුන්ගේ පාසැල් තුල ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය පසුබිම සකස් කර දීමටද අපේක්ෂා කරයි.

මෙහිදී කොළඹ දිස්ත්‍රික්කයේ පරිසර නියමු වැඩසටහන ක්‍රියාත්මක කරන පාසැල් 30 ක් නියෝජනය වන පරිදි පරිසර නියමුවන් 200 ක් සහ එක් ගුරුවරයෙක් බැගින් 230 ක් සහභාගී කරවා ගැනීමට නියමිතය. අධ්‍යාපන අමාත්‍යාංශය, බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හා බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡාවක් පවත්වා පාසැල් තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

**වැඩසටහන් විස්තරය:** මෙහිදි මෙම ප්‍රයෝගික වැඩමුළුව තේමාවන් 4ක් යටතේ කණ්ඩායම් 4 කට බෙදා සිදුකිරීමට බලාපොරොත්තු වන අතර සෑම සිසුවෙක්ම සහ ගුරුවරයෙක්ම සියළුම කණ්ඩායම් වල ක්‍රියාකාරකම් වලට සහභාගී වේ.

න්‍යාය පත්‍රය: කඩොලාන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව

| වේලාව | වැඩසටහන් විස්තරය |
|---|---|
| පෙ.ව 11.00 - පෙ.ව 12.00 | සිසුන් ලියාපදිංචිය සහ දිවා ආහාරය ලබාදීම |
| පෙ.ව 12.00 - ප.ව 12.10 | සිසුන් පිළිගැනීම සහ අරමුණ පැහැදිලි කිරීම<br>ආර්.එච්.එම්.පී අබේකෝන්, අධ්‍යක්ෂ (ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය), මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය |
| ප.ව 12.10 - ප.ව 12.45 | කඩොලාන පරිසර පද්ධතිය පිළිබඳ දේශණය<br>ආචාර්ය සෙව්වන්දි ජයකොඩි මහත්මිය<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වයඹ විශ්ව විද්‍යාලය, සභාපති, කඩොලාන සංරක්ෂණය සහ තිරසර භාවිතය සම්බන්ධ විද්වත් කමිටුව |
| ප.ව 12.45 - ප.ව 1.00 | සිසුන් කණ්ඩායම් 4 කට වෙන් කිරීම |
| ප.ව. 1.00 - ප.ව 3.00 | කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>මෙහිදී එක් කණ්ඩායමක් විනාඩි 30 ක කාලයක් ගත කරන අතර සෑම සිසුවෙක්ම කණ්ඩායම් 4හිම ක්‍රියාකාරකම් සඳහා සහභාගී වේ. |
| | කණ්ඩායම් 1 : කඩොලාන විශේෂ ප්‍රායෝගිකව හඳුනා ගැනීම<br>තේමාව: “මොනවද මෙම කඩොල් කොතනද අපි දකින්නේ....”<br>ඉලක්කය: කඩොලාන විශේෂ 22 හඳුන්වාදීම<br>මෙහෙයවීම: මනෝජ් ප්‍රසන්න මහතා, වැඩසටහන් සහකාර, වායු සම්පත් සහ ජාතික ඕසෝන් ඒකකය<br>ඩග්ලස් තිසේරා මහතා, සුළු ධීවර සම්මේලනය, පම්බල |
| | කණ්ඩායම් 2 : කඩොලාන පිළිබඳ ප්‍රශ්ණෝත්තර වැඩසටහන<br>තේමාව: “මම දකිමි, මම දනිමි ...............කඩොලාන”<br>ඉලක්කය: කඩොලාන පිළිබඳ දැනුම පිළිබඳ විමසීම<br>මෙහෙයවීම: ආචාර්ය සෙව්වන්දි ජයකොඩි මහත්මිය,<br>ආචාර්ය ආර් ඥානේෂ්වරන් මහත්මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, යාපනය විශ්ව විද්‍යාලය සහජෛවවිවිධත්ව අංශයේ නිළධාරීන් |
| | කණ්ඩායම් 3: කඩොලාන පරිසර පද්ධතිය පිළිබඳ පෝස්ටර් නිර්මාණය<br>තේමාව: “පෑනෙන් පින්සලෙන් හරඹ දක්වමු”<br>ඉලක්කය: පරිසරය පිළිබඳ දැනුවත් කතිකාවතක් ඇතිකල හැකි නිර්මාණ කිරීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීම<br>මෙහෙයවීම: ධනුෂ්ක අබේසිංහ මහතා, CITIES ලේකම් කාර්යාලය<br>කලනි ජයරත්න මිය, කළමනාකරණ සහකාර, පාලන අංශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාතයාංශය |
| | කණ්ඩායම් 4 - කඩොලාන පරිසර පද්ධතිය පිළිබඳ වීඩියෝ පට නැරඹීම<br>තේමාව: “විදිමු රසාස්වාදය ගොඩනගමු තිරසර ආකල්ප”<br>ඉලක්කය: කඩොලාන පරිසරය අගය කිරීමට සහ එහි සුන්දරත්වය අත් විදීමට අවස්ථාවක් ලබාදීම<br>මෙහෙයවීම: අසංක විජේවර්ධන මහතා, වැඩසටහන් සහකාර, ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය |
| ප.ව 3.00 | වැඩසටහන් නිමාව |

# සමුද්‍ර පරිසරය පිළිබඳ සිව්වන ජාතික විද්වත් සමුළුව 2018

**Venue:** ලෝටස් ශාලාව

**Date:** 2018 ඔක්තෝබර් 20

**Time:** පෙ.ව 8.30 - ප.ව 5.00

සයුර මිහිතලයේ හදවතයි. සාගරය විසින් මනුෂ්‍ය වර්ගයා වෙත ලබා දෙනු ලැබූ ජීවයේ ගුණාත්මකභාවය පවත්වාගනිමින් සහ පූර්ණ සාගර පරිසර පද්ධති පවත්වාගෙන යාම උදෙසා සමුද්‍ර සම්පත් කළමනාකරණය සහ පාලනය සඳහා අපගේ දැක්ම වෙනස්කරගත යුතු වේ. අප සමාජයේ සහ අනාගත පරපුරේ ආරක්ෂාව සහ සෞඛ්‍යය තත්ත්වය සුරකිනු වස් සයුර රැකගැනීම අපගේ අනිවාර්ය වගකීමකි.

සමුද්‍ර නාවික සම්පත් පාදක කරගත් ආර්ථිකයක් කරා පියනගන රටක් වශයෙන්, රජය විසින් සමුද්‍ර සම්පත් සහ නාවික ක්ෂේත්‍රය ආශ්‍රිත කර්මාන්තයන් වර්ධනය කිරීම සඳහා අවැසි පියවර දැනටමත් ක්‍රියාත්මක කර ඇත. වෙරළාශ්‍රිත සංවර්ධන කටයුතු පුළුල් වීමත් සමඟ පරිසරය දූෂණය වීමේ අවධානමද සාපේක්ෂව ඉහළ යන අතර සමුද්‍ර පරිසරයේ සහ ඒ ආශ්‍රිත කර්මාන්තවල පැවැත්ම තහවුරු කරගනිමින් නීල ආර්ථිකයක් කරා ගමන් කිරීම සඳහා සමුද්‍රාශ්‍රිත පර්යේෂණ කටයුතු සහ පෘථුල ප්‍රතිපත්තීන් සකස්කළ යුතුව පවතී.

මෙම ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන් දැනුවත් කිරීම සහ පර්යේෂකයින් දිරිගැන්වීමේ අටියෙන් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මේ වන විට පිළිවෙලින් 2013, 2015 සහ 2017 වසරවලදී විද්වත් සමුළු තුනක් පවත්වා ඇත. සිව්වන විද්වත් සමුළුව ශ්‍රී ලංකා නෙක්ස්ට් වැඩසටහනට සමගාමීව 2018 වසරේ ඔක්තෝබර් මස 20 වන දින පවත්වනු ලැබේ. දිවයිනේ ප්‍රචලිත විද්‍යාඥයින්, වෘත්තිකයන්, ප්‍රතිපත්ති සම්පාදකයින් රැසකගේ සහභාගීත්වයෙන් පැවැත්වෙන මෙය ක්ෂේත්‍රයේ නව සොයාගැනීම් පිළිබඳ දැනුවත් වීම සඳහාත් සමුද්‍ර පරිසරය හා ඒ ආශ්‍රිත නව්‍යතාවයන් පිළිබඳ සංවාද කිරීම කදිම තෝතැන්නක් වනු ඇත.

මෙහිදී සමුද්‍රීය පරිසරය, සංචාරක කර්මාන්තය සහ සමාජ ආර්ථිකය, ධීවර ජල ජීවී සහ සමුද්‍රීය පරිසරය, සංවර්ධන ව්‍යාපෘති සහ සමුද්‍රීය පරිසරයට සිදු වන බලපෑම්, නාවික කටයුතු සහ සමුද්‍රීය පරිසරය, සමුද්‍රීය දූෂණය සහ හා ආශ්‍රිත නීතිකරණය, සංවේදී සමුද්‍රීය පරිසර පද්ධති සහ සමුද්‍රීය ආරක්ෂිත ප්‍රදේශ සහ දේශගුණ විපර්යාස සහ සමුද්‍රීය පරිසරයට ඇති කරන බලපෑම් යන ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ සාකච්ඡා පැවැත් වෙනු ඇත.

**විද්වත් සමුළුව පැවැත්වීමේ අරමුණු :** ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්,* සමුද්‍රීය පරිසරය පිළිබඳ 04 වන විද්වත් සමුළුව මඟින් සමුද්‍රීය පරිසරය සංරක්ෂණය පිළිබඳ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය සහ නව පර්යේෂණ සොයා ගැනීම් ඉදිරිපත් කිරීම සඳහා වේදිකාවක් සකස් කිරීම.

**තේමාව :** ***"පිවිතුරු සයුරක් තුළින් නීල ආර්ථිකයක්"***

**ඉලක්ක ගත කණ්ඩායම් සහ සහභාගී වන්නන් ගණන:** දේශීය සහ ප්‍රාදේශීය විද්‍යාඥයින් සහ පර්යේෂකයින්, ප්‍රතිපත්ති සම්පාදකයින්, රාජ්‍යය නොවන සංවිධාන, විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්, රජයේ නිලධාරීන් (350 ක් පමණ)

**සම්පත් දායකයන්:** සමුද්‍රීය පරිසර ක්ෂේත්‍රය තුළ විශ්ව විද්‍යාල වෘත්තිකයන් සහ විශේෂඥයන්

**වැඩිදුර විස්තර සඳහා:**

- නිලන්ත පියදාස මහතා
  (+94 (0) 11 267 2752, +94 (0) 71 818 1430, nilanthaip@yahoo.com)
- ඉසුරු ප්‍රනාන්දු මහතා
  (+94 (0) 71 493 9812, planningmepa@gmail.com)

**න්‍යාය පත්‍රය: සමුද්‍ර පරිසරය පිළිබඳ සිව්වන ජාතික විද්වත් සමුළුව 2018**

| වේලාව | වැඩසටහන් විස්තරය |
|---|---|
| පෙ.ව8.40 | සහභාගීවන්නන් ලියාපදිංචිය |
| පෙ.ව9.10 | ප්‍රධාන ආරාධිත අමුත්තාගේ සම්ප්‍රාප්තිය |
| පෙ.ව9.15 | පොල්තෙල් පහන දැල්වීම හා ජාතික ගීය ගායනය |
| පෙ.ව9.20 | පිළිගැනීමේ කථාව |
| පෙ.ව9.30 | ප්‍රධාන ආරාධිත අමුත්තාගේ කතාව |
| පෙ.ව9.45 | හිටපු නාවික හමුදාපති ආචාර්ය ජයනාත් කොළඹගේ මහතා විසින් පවත්වන ආරාධිත දේශනය |
| පෙ.ව10.15 | සමාරම්භක උත්සවයේ අවසානය |
| පෙ.ව10.20 | සංග්‍රහ කටයුතු |
| පෙ.ව10.50 | පළමු සැසිය: සමුද්‍ර පරිසරය, සංවේදී සමුද්‍ර පරිසර පද්ධති සහ සමුද්‍ර රක්ෂිත ප්‍රදේශ |
| ප.ව12.00 | දෙවන සැසිය: පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය සහ වෙරළ කළමනාකරණය |
| ප.ව01.00 | දිවා ආහාරය |
| ප.ව02.00 | තෙවන සැසිය: ධීවර කර්මාන්තය, ජලජීවී වගාව සහ සමුද්‍ර පරිසරය |
| ප.ව03.00 | තේ විවේකය |
| ප.ව03.30 | හතර වන සැසිය: නාවික, සමුද්‍ර දූෂණය හා අදාළ නීති |
| ප.ව05.00 | වැඩසටහනේ නිමාව |

## රාජ්‍ය - පුද්ගලික - ප්‍රජා සහයෝගීතාවයෙන් ජාතික රුක් රෝපණ වැඩසටහන ප්‍රවර්ධනය කිරීම

| | |
|---|---|
| **Venue:** | සැෆ්රොන් ශාලාව |
| **Date:** | 2018 ඔක්තෝබර් 20 |
| **Time:** | පෙ.ව 8.30 - ප.ව 4.30 |

ජාතික වන රෝපණ වැඩසටහන (වනරෝපා) සහ වන ආශ්‍රිත භූමි ප්‍රතිස්ථාපනය කිරීමට රාජ්‍ය-පුද්ගලික-ප්‍රජා යන බහු පාර්ශවික හවුල්කරුවන් සතු විද්‍යාත්මක දැනුම සහ තොරතුරු හඳුනාගැනීමට, ලේඛනගත කිරීමට, ඒකාබද්ධ කිරීමට සහ බෙදා හැරීම උදෙසා මෙම වැඩසටහන නිර්මාණය කර ඇත.

වන රෝපා වැඩසටහන ජාතික මට්ටමින් හරිත ආවරණය වර්ධනයට පමණක් නොව ගෝලීය ප්‍රතිලාභ සහ දේශගුණික විපර්යාස සඳහා මුහුණ දීමේ ජාතික වැඩසටහන සඳහා ද ධනාත්මක ප්‍රතිලාභ ලබා දෙනු ඇත.

ක්‍රමානුකූලව දත්ත රැස් කිරීම හරහා රුක් රෝපණය සහ වන ආශ්‍රිත භූමි ප්‍රතිස්ථාපනය කිරීම වෙනුවෙන් කටයුතු කරන රාජ්‍ය, රාජ්‍ය නොවන ආයතන, පුද්ගලික අංශයේ ආයතන, ප්‍රජා සංවිධාන සහ පාසල් වැනි විවිධ ආයතන මඟින් සිදු කරන කටයුතු; කවුරුන්, කුමක්, කුමන ස්ථානයකද යන්න පිළිබඳව නිවැරදිව හඳුනා ගත හැකි වනු ඇත. මෙම වැඩසටහන ශ්‍රී ලාංකීය උත්සාහයන් දිරිමත් කිරීම් සහ හඳුනාගැනීම් අධීක්ෂණය කිරීමේ මෙවලමක් ලෙස හැඳින්විය හැකිය. එමෙන්ම, මේ තුළින් Bonn Challenge වැනි ගෝලීය වැඩසටහන් සමඟ ඒකාබද්ධ වීමේ ප්‍රවණතාවය ද වේ.

**අරමුණු:**

- විවිධ ආයතන සහ සංවිධාන මඟින් දැනට සහ අනාගතයේ සිදු කිරීමට යෝජිත වනාන්තර ප්‍රතිසංවිධානය කිරීමේ වැඩසටහන පිළිබඳ හඳුනගැනීම සහ එම තොරතුරු ජාතික දත්ත පද්ධතියකට ඇතුලත් කිරීම
- වන ආශ්‍රිත භූමි ප්‍රතිස්ථාපනය පිළිබඳව පවතින ගෝලීය දැනුම සහ මෙවලම් ඉදිරිපත් කිරීම සහ බෙදා ගැනීම

**න්‍යාය පත්‍රය:**

- තොරතුරු ව්‍යාප්ත කිරීම/ බෙදා හැරීම ආරම්භ කිරීම (ප්‍රකාශන, පෝස්ටර්, චිත්‍රපට, විද්‍යුත් පට සහ ඉදිරිපත් කිරීම් මඟින්)
- තොරතුරු බෙදා හැරීමට අමතරව, නම් කරන ලද කණ්ඩායම් එක්වී පරිගණක භාවිතයෙන් සහභාගිකරුවන් සතුව ඇති රුක් රෝපණය සම්බන්ධ (දැනට සිදුවන සහ අනාගත) වැඩසටහන් සහ දායකත්වයන් ගූගල් (Google) ආශ්‍රිත භූගෝලීය දත්ත පද්ධතියකට ඇතුලත් කිරීම.

**ඉලක්කකණ්ඩායම:** ශ්‍රී ලංකාවේ රුක් රෝපණය සහ වන ආශ්‍රිත භූමි ප්‍රතිස්ථාපනය සම්බන්ධයෙන් කටයුතු කරන රාජ්‍ය, පුද්ගලික, රාජ්‍ය - නොවන ආයතන, ප්‍රජා සංවිධාන

**වැඩිදුර තොරතුරු සඳහා:**

- නාලින් පෙරේරා
  (+94 (0) 71 933 4313/ Naalin.Perera@iucn.org)
- දිනිති සමරතුංග
  (+94 (0) 702350502/ Dinithi.Samarathunga@iucn.org)

ශ්‍රී ලංකා නෙක්ස්ට් - නීල හරිත යුගයක් 2018 සම්මන්ත්‍රනය හා ප්‍රදර්ශණය ඔක්තෝම්බර් මස 19 සහ 20 දෙදින තුල බණ්ඩාරනායක අනුස්මරනජාත්‍යාන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වීමට තීරණය කිරීමෙන් අනතුරුව එහි වැඩකටයුතු සාර්ථක කර ගැනිම අරමුණු කරගනිමින් ශ්‍රී ලංකා නෙක්ස්ට් ලේකම් කාර්යාලය ඇතුළුව සංවිධාන කමිටු හයක් ස්ථාපනය කරන ලදි.

එවානම්;

1. ශ්‍රී ලංකා නෙක්ස්ට් ලේකම් කාර්යාලය
2. මුල්‍ය කමිටුව
3. සැපයුම් හා සේවා කමිටුව
4. ප්‍රදර්ශණ කමිටුව
5. මාධ්‍ය කමිටුව
6. පර්යේෂණ සම්මන්ත්‍රන කමිටුව

එම කමිටු වල සංයුතිය පහත පරිදිවේ.

**මෙහෙයවීම හා අධීක්ෂණය:**

අනුර දිසානායක මහතා, ලේකම්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

## 1. ශ්‍රී ලංකා නෙක්ස්ට් - 2018 ලේකම් කාර්යාලය

**සම සභාපති:**

- රියර් අද්මිරාල් රෝහණ පෙරේරා මයා, සභාපති, සමුද්‍රිය දූෂණ පාලන අධිකාරිය
- ආචාර්ය සුනිමල් ජයතුංග මයා, අධ්‍යක්ෂ, දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

**ලේකම්:**

- ධම්මිකා විජේසිංහ මෙය, අධ්‍යක්ෂ, පරිසර සැලසුම් හා ආර්ථික අංශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

**කමිටු සාමාජිකයින්:**

- ලෝෂිණී පීරිස් මිය, ජ්‍යෂ්ඨ අතිරේක ලේකම්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
- දීපා ලියනගේ මිය, අධ්‍යක්ෂ, අන්තර්ජාතික සබඳතා අංශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
- හිමාලි ද කොස්තා මිය, සහකාර අධ්‍යක්ෂ, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
- ලතිකා හපුආරච්චි මිය,සහකාර අධ්‍යක්ෂ, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
- අමල් රණවීර මයා, සහකාර අධ්‍යක්ෂ, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

**සමායෝජකයින්:**

- අනුරුද්ධ තෙන්නකෝන් මයා, සහකාර අධ්‍යක්ෂ, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
- එච්.එන්.කේ.ටී දුලානි මිය, සහකාර අධ්‍යක්ෂ, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

## 2. මුල්‍ය කමිටුව

**සභාපති:**

- ජී.බී.ඒ පියතිලක මයා, සභාපති, මධ්‍යම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ උපදේශණ කාර්යාංශය

**කමිටු සාමාජිකයින්:**

- අමාත්‍යාංශය යටතේ ඇති සියළු ආයතන වල සභාපතිවරු

- ප්‍රධාන ගණකාධිකාරි, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

**සමායෝජක:**

- මොදිකා තිලකරත්න මිය, සහකාර අධ්‍යක්ෂ, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

## 3. සැපයුම් හා සේවා කමිටුව

**සභාපති:**

- ආර්.ඒ ආර්.ආර් රූපසිංහ මයා, අතිරේක ලේකම් (පාලන), මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

**කමිටු සාමාජිකයින්:**

- මහින්ද ගුණරත්න මයා, අධ්‍යක්ෂ, ප්‍රතිපත්ති සැලසුම් හා මෙහෙයුම් අංශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

**සමායෝජක:**

- රූපිකා බක්මීදෙණිය මිය, සහකාර අධ්‍යක්ෂ, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
- ඉරේෂා රාජපක්ෂ මිය, සහකාර අධ්‍යක්ෂ, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
- තිරීස් ඉනෝකා මෙය, සහකාර අධ්‍යක්ෂ, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
- රුවන් වීරසූරිය මයා, සහකාර අධ්‍යක්ෂ, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

## 4. ප්‍රදර්ශණ කමිටුව

**සභාපති:**

- සී. පල්ලේගම මයා, සභාපති, මධ්‍යම පරිසර අධිකාරිය

**කමිටු සාමාජිකයින්:**

- සුගත් ධර්මකිර්ති මයා, අධ්‍යක්ෂ, වායු සම්පත් කළමනාකරණ හා ජාතික ඕසෝන ඒකකය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
- මහින්ද වේරහැර මයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

**සමායෝජක:**

- සේපාලි සිල්වා මිය, සහකාර අධ්‍යක්ෂ, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

## 5. මාධ්‍ය කමිටුව

**සභාපති:**

- එම්.පී.ඩී.යූ.කේ මාපා පතිරණ මයා, අතිරේක ලේකම් (පරිසර ව්‍යාපෘති අධ්‍යාපන පුහුණු), මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

**කමිටු සාමාජිකයින්:**

- ප්‍රභාත් චන්ද්‍ර කීර්ති මයා, අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්ත මේන්තුව
- සුගත් ධර්මකිර්ති මයා, අධ්‍යක්ෂ, වායු සම්පත් කළමනාකරණ හා ජාතික ඕසෝන් ඒකකය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
- ඩී. සොමිරත්න මයා, සහකාර ලේකම්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
- සුජීවා ප්‍රනාන්දු, සහකාර අධ්‍යක්ෂ, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
- චොෂිතා විජයනායක, විධායක අධ්‍යක්ෂ, ස්ලයිකැන් ට්‍රස්ට්

**සමායෝජක:**

- රංජිත් රාජපක්ෂ මයා, සහකාර අධ්‍යක්ෂ, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

## 6. පර්යේෂණ සම්මන්ත්‍රන කමිටුව

**සභාපති:**

- මහාචාර්ය ඩබ්. එල්. සුමතිපාල මයා, උපදේශක, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

**කමිටු සාමාජිකයින්:**

- ආචාර්ය ටර්නි ප්‍රදීප් කුමාර මයා, සාමාන්‍ය අධිකාරී, සමුද්‍රිය දූෂණ පාලන අධිකාරිය
- සී.එච්.ඊ. ආර් සිරිවර්ධන මයා, අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
- ආචාර්ය නිමල් රුවන්පතිරණ මයා, සාමාන්‍ය අධිකාරී, රාජ්‍ය දැව සංස්ථාව
- ආචාර්ය එන්.ඩී.ආර් වීරවර්ධණ මයා, අතිරේක වනසංරක්ෂක, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- ආචාර්ය ප්‍රශාන් ප්‍රැන්සිස් මයා, අධ්‍යක්ෂ ජනරාල්, මැණික් හා ස්වර්ණාභරණ පුහුණු පර්යේෂණ අභ්‍යාස ආයතනය
- අජිත් සිල්වා මයා, අධ්‍යක්ෂ, භූමි සම්පත්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

**සමායෝජකයින්:**

- නිල්මිණී වික්‍රමාරච්චි මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
- දක්ෂිණී පෙරේරා මිය, සහකාර අධ්‍යක්ෂ, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

“තිරසාර නිෂ්පාදනයක් හා පරිභෝජනයක් සහිත සරළ ජීවන ක්‍රමයක් තුළින් අඩු කාබන් විමෝචනයක් සහිත සංවර්ධනයක් උදා කර ගනිමු”


මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

“සොබාදම්පියස”

416/C/01, රොබර්ට් ගුණවර්ධන මාවත,

බත්තරමුල්ල , ශ්‍රී ලංකාව